*Vidyodaya J. Arts, Sci., Let., Silver Jubilee, pp.* 222-252

# පැපිළියානේ සුනේත්‍රා මහා දේවි පිරිවෙන ඇසුරින් ශ්‍රී ලංකාවේ පහළොස් වැනි සියවසේ බෞද්ධ ආරාමයක අයවැය සැලැස්ම

මැන්දිස් රෝහණදීර විසිනි.

## 1. පසුබිම හා මූලාශ්‍රය තොරතුරු.

ශ්‍රී ලංකාවේ බෞද්ධ ආරාමවල ද ඒවායේ වසමින් ලෝක සාසන සේවයේ යෙදී සිටි භික්ෂූන් වහන්සේගේද පැවත්ම හා නඩත්තුව පිණිස ඒ ඒ වකවානුවල රාජ රාජ මහාමාත්‍යාදීන් විසින් පිරිණමන ලද විවිධ දේපළ පිළිබඳ තොරතුරු සම්භාරයක් සාහිත්‍ය මූලාශ්‍රයවලින්ද, ඊටත් වඩා සවිස්තරව සෙල්ලිපි මූලාශ්‍රයවලින්ද සොයා ගත හැකිය. එසේ වුවද ඒ දේපළ පරිහරණය කළ ආකාරය පිළිබඳ තොරතුරු එතරම් සුලබ නැත.

මේ අතින් 10 වැනි සියවසේ සෑගිරි හා අබයගිරි විහාරවල දේපළ පරිහරණය හා පාලනය පිළිබඳව IV **මහින්දගේ** මිහින්තලා පුවරු ලිපි වලින් හා V **කාශ්‍යපගේ** අබයගිරි ලිපියෙන් ලැබෙන තොරතුරු[1] අද්වීතීය ගණයේ ලා සැලකිය හැකිය. මේ තොරතුරු ආශ්‍රයෙන් දහ වැනි සියවස තරම වන විට මිහින්තලේ චේතියගිරි විහාරයේ ද අනුරාධපුර අබයගිරි විහාරයේද පැවැති ආර්ථික ව්‍යූහය පිළිබඳ සවිස්තර චිත්‍රයක් ගොඩ නහා ගත හැකිය. මේ ආරාම සන්තක ගම් බිම් කෙත්වතු දාසි දස් ආදියද ආරාම හා සම්බන්ධ විවිධ සේවා හා වෘත්තීන්ද ඒවායේ නියැළී සිටි විවිධ තරාතිරමේ පුද්ගලයන් ද ඔවුන් ලැබූ වැටුප් සහ දීමනා ආදියද මේ පුවරු ලිපි වලින් සවිස්තරව සොයා ගත හැකිය.[2] 10 වැනි සියවසේ සෑගිරි විහාරය සහ අබයගිරි විහාරය පිළිබඳ මේ තොරතුරු එම යුගයේ ජේතවන විහාරය මහා විහාරය වැනි වෙනත් ආගමික ආයතනවල පැවැති ආර්ථික ක්‍රියාකාරකම්වල මූලික ස්වරූපය වටහා ගැනීමටද බොහෝ දුරට උපකාර කර ගත හැකිය.

දහවැනි සියවසෙන් පසුව විහාර දේපළ පිළිබඳ තොරතුරු ලැබෙන සෙල්ලිපි හමුව තිබේ. නිදසුන් වශයෙන් II **පරාක්‍රමබාහු** රජුගේ සමයේ පිහිටුවන ලදැයි අනුමාන කෙරෙන ගලපාත ලිපියේ, ගලපාත විහාරයට පුදන ලද ඉඩකඩම් හා වහලුන් පිළිබඳ තොරතුරු ඇතුළත් වේ.[3] එහෙත් ඒ ඉඩ කඩම්වල නිශ්චිත ප්‍රමාණයන්, ඒවායේ ආදායම් පරිහරණය කළ ආකාරය හා ඒවායේ නියුක්ත වූවන්ට ගෙවූ වැටුප් දීමනා ආදිය ගැන තොරතුරු නැත.

ගම්පළ යුගය වන විට විහාර දේපළ පිළිබඳ මීට වඩා සවිස්තරව ඒ ඒ තැනින් ඒ ඒ පුද්ගලයන් පිදූ ඉඩම්වල ප්‍රමාණයන් සමග තොරතුරු ලැබේ. නිදසුන් වශයෙන් කිත්සිරිමෙවන් කැළණි විහාරය, ගඩලාදෙණි විහාරය හා ලංකාතිලක විහාරය පිළිබඳව ලැබෙන තොරතුරු දැක්විය හැකිය.

---

1. **Epigraphia Ceylonica, EZ.**, *Vol.* 1, pp. 84–90; pp. 43–46.
2. මේ තොරතුරු ඇසුරු කරගෙන **ආර්. ඒ. එල්. එච්. ගුණවර්ධන** පූර්ව මධ්‍යතන යුගයේ ආරාම දේපල පරිපාලනය පිළිබඳව සවිස්තර අධ්‍යයනයක් කොට ඇත. බලන්න.

   **R. A. L. H. Gunawardhane, Robe and Plough,** Monasticism and Economic Interest in Early Medieval Sri Lanka. The University of Arizona Press, Arizona, 1979, Chapter 3. The management of Monastic Property, pp. 95–136.
3. EZ., IV, pp. 196–211.

ක්‍රි. ව. 1344 වැන්නේ පිහිටුවන ලද කිත්සිරිමෙවන් කැළණි විහාර ලිපියට අනුව විල්ගම්මුළ මාහිමියන් වහන්සේ එම විහාරයේ පැවැත්ම සඳහා කුඹුරු බිජුවට දෙ යාළ පසළොස් අමුණක්ද, ගැහැණු පිරිමි වහලුන් තිස් දෙනකුද පුද ඇත.[1] එම වර්ෂයේම එනම්, ක්‍රි.ව. 1344 දී පිහිටුවන ලද ගඩලාදෙණි සෙල්ලිපියේ[2] දක්වා ඇති පරිදි එම විහාරයේ පැවැත්ම සඳහා සේනාලංකාධිකාරී සෙනෙවි රදුන් ඇතුළු නොයෙක් තරාතිරමේ පුද්ගලයන් යටත් පිරිසෙයින් තිස් දෙනකු පමණ ඒ ඒ තැනින් යාල් අමුණු පැල් ආදී වශයෙන් බොහෝ කොටම කුඹුරු ඉඩම් පූජා කොට ඇත. සෙල්ලිපියේ මැකී ගිය දෙකුන් පළක එන ගණන් හැරෙන විට මේ බිම් ප්‍රමාණ එකතු කළ කල්හි දළ වශයෙන් යාල් හයයි, අමුණු හයක මුළු ඉඩම් ප්‍රමාණයක් ලැබේ. එය අමුණු වලින් 146ක් වන අතර අකකර වලින් 292 ක කුඹුරු බිම් ප්‍රමාණයකි.[3] එසේ වුවද මේ සෙල්ලිපිවලින් දක්වෙන ඉඩම්වල ආදයම පාලනය කළ ආකාරය හෝ භුක්ති විදි ආකාරය ගැන කිසිදු තොරතුරක් නොලැබේ.

ඉහත සඳහන් සෙල්ලිපි දෙක පිහිටුවූ, ක්‍රි.ව. 1344 වර්ෂයේම පිහිටුවන ලද ලංකාතිලක ලිපියේ[4] මීට වඩා සවිස්තර හා නිශ්චිත තොරතුරු ලැබේ. මේ ලිපියට අනුව ක්‍රි.ව. 1344 දී ලංකාතිලක විහාරයට පුදනලද මුළු ඉඩම් ප්‍රමාණය යාල් 17යි අමුණු 120යි පසු කලක අලවල අමුණු ලිපිය පිහිටුවන වකවානුව වන විට ඉහත කී ඉඩම්වලින් අතිරේක කොටස් ද විහාරයට පූජා කරන ලදුව ඉඩම් ප්‍රමාණය විශාල වී ඇත.[5] ඒ අනුව ලංකා තිලක විහාරය සතුව තිබූ කුඹුරු ඉඩම් ප්‍රමාණය යාල් 100කි. එනම් අමුණු 2000 කි. අක්කර වශයෙන් ගතහොත් 4000 කට වැඩිය.

කුඹුරු ඉඩම් අක්කර හාරදහසක ප්‍රමාණයට අතිරේකව ක්‍රි.ව. 1344 ලිපියෙන් ගැහැණු පිරිමි වහලුන් 200 ක්ද, එළ හරක් මී හරක් 400 ක්ද, රත්රන් රිදී තඹක්ක ඇතුළු භාණ්ඩද, යටත් පිරිසයින් උඩරට ගෙයකින් අවුරුද්දකට පමණ ගණනේ ආදයමද, වෙළඳුන්ගෙන් විකුණන හා ගන්නා බඩු වල මිලෙන් සියයට කාලක් බැගින් වන තීරු බද්දද මෙවක ලංකාතිලක විහාරයට පූජා කොට තිබේ. එහෙයින් ඉහත සලකා බලන ලද සෙල්ලිපි වලින් ඒ ඒ විහාරවල දේපළ පිළිබඳව ලැබුණු තොරතුරුවලට වඩා නිශ්චිත හා සවිස්තර තොරතුරු ලංකාතිලක විහාරය පිළිබඳවූ ලිපිවලින් ලැබෙන බව කිය යුතුය.

ලංකාතිලක විහාර සන්තක ඉහත කී දේපළ භුක්ති විදිය යුතු ආකාරය පිළිබඳ ඉතා දළ සටහනක් ද ලංකාතිලක ලිපියෙන් ලැබෙන බව මෙහිලා සිහිපත් කළයුතුය. ඉහත කී විහාර ලාභය කොටස් පහකට බෙදිය යුතුය. ඉන් තුනුරුවනට කොටස් තුනක්ද, දෙවියන්ට එක් කොටසක් ද, සේනාලංකාධිකාර සෙනෙවිරදුන්ගේ දරුමුණුපුරු පරපුරෙන් ලංකාතිලක විහාරයට බැදී පවත්වන කෙනකුට ඉතිරි කොටස ද යන වශයෙන් වෙන් කොට තිබේ. ගෙයකින් පණම ගණනේ ලැබෙන ආදයමත් වෙළඳාමෙන් ලැබෙන තීරු බදු ආදයමත් විහාරයට දී ඇත්තේ විහාරයේ එතෙක් කොට ඇති කටයුතු වැඩි දියුණු කිරීමටත් නොකළ කටයුතු කිරීමටත් බුදුන්ට හා දෙවියන්ට නිරන්තරයෙන් බත් මල් පහන් ඇතුළු පුද පූජා පැවැත්වීමටත් බවද ලිපියේ වචන යෙදී ඇති ආකාරයෙන් හැඟේ. එසේ වුවද ඉන් පසුව සියලු වස්තුව ඇතුළු හැම ලාභයම කොටස් පහකට

---

1. **Ceylon Almanac and Literary Registar, CALR.,** Vol. 1, p. 56.
2. EZ., IV, pp. 90–10.
3. යාළකට අමුණු 20 කි. අමුණක වපසරිය අක්කර 2 ත් 2½ ත් අතරේ විය හැකිය. **ආරියපාල, ඇම්. බී. මධ්‍යකාලීන ලංකා සමාජය,** 1962. 139. පිට
4. **Lankatilake Inscriptions, University of Ceylon Reviews, UCR.** Vol. XVIII, p. 56.
5. **UCR.,** XVIII, p. 40.

බෙදිය යුතු බවට එන නියමය නිසා එකී මුදලින් ලද ආදයමද කොටස් පහකට බෙදිය යුතු බව සලකන්නට සිදුවේ. අනෙක් අතින් සියලු ලාභයෙන් 3/5 ක් තුනුරුවන් සඳහා වෙන් කොට වියදම් කරනු ලැබුයේ කෙසේදැයි පැහැදිලි කරගැනීමටද රුකුල් නැත. එසේම දෙවියන් සඳහා 1/5ක් වියදම් කෙළේ කවර පුද සේවා සඳහාදැයිද පැහැදිලි නැත. තවද ඉතිරි 1/5ක්වූ ලාභය සේනාලංකාධිකාර පරපුරෙන් විහාර සේවයේ යෙදී සිටියවුන් අතර බෙදුණේ කෙසේදැයිද පැහැදිලි නැත. ඔවුන් කරන ලද සේවා ගැන හෝ ඒ සේවා සඳහා ගෙවූ වැටුප් ගැන හෝ තොරතුරු නො ලැබේ. මෙසේ බලන විට ලංකාතිලක විහාරයේ දේපළ භුක්ති විඳිය යුතු ආකාරය පිළිබඳව සෙල්ලිපියෙන් ලැබෙන්නේ ඉතා දළ අදහසක් පමණක් බව පැහැදිලි වේ.

## පැපිළියාන ලිපි

මේ යුගයේ විහාර දේපළ පිළිබඳ තොරතුරුද එසේම ඒවා පරිහරණය කළ ආකාරය පිළිබඳවද ලංකාතිලක ලිපියේ ඇතුවාට වඩා සම්පූර්ණ තොරතුරු අපට ලැබෙන්නේ පහළොස් වැනි සියවසේ පැපිළියානේ සුනේත්‍රා මහා දේවි පිරිවෙන පිළිබඳ ලිපිවලිනි. ඒ අතින් බලන විට දහ වැනි සියවසේ බෞද්ධ ආරාමික දේපළ හා ඒවා පරිහරණය කළ ආකාරය පිළිබඳ සවිස්තර තොරතුරු සපයන මිහින්තලේ පුවරු ලිපිවලට පසුව එබඳු සුප්‍රකට බෞද්ධ ආයතනයක තොරතුරු සපයන එකම මූලාශ්‍ර මේ පැපිළියාන ලිපි බව සඳහන් කළයුතුය.

මේ ලිපි වලින් 15 වැනි සියවස මුල් භාගය තුළ පැපිළියානේ සුනේත්‍රා මහා දේවි පිරිවෙනට ඒ ඒ අවස්ථාවල පුදන ලද ගොඩ මඩ ඉඩම් බොහෝ කොට නිශ්චිත වපසරි ප්‍රමාණ සහිතව ලැබෙන අතර විහාරයේ දෛනික මාසික හා වාර්ෂික වැය ශීර්ෂ ගැනද තොරතුරු ලැබේ.

පැපිළියාන පිළිබඳ වූ මේ ලිපිවල එන කරුණු උපයෝගී කොට ගෙන 15 වැනි සියවසේ පැපිළියානේ සුනේත්‍රා මහා දේවි පිරිවෙන සන්තකව පැවැති දේපළ ප්‍රමාණ හා ඒ දේපළ පරිහරණය කළ ආකාරය පිළිබඳ අධ්‍යයනයක් කිරීම මේ ලිපියේ මුඛ්‍ය අරමුණය.[1] එබඳු අධ්‍යයනයකින් සුනේත්‍රා මහා දේවි පිරිවෙනේ පමණක් නොව 15 වැනි සියවසේ ලංකාවේ වෙනත් ප්‍රකට බෞද්ධ ආශ්‍රමවලද පැවැති විහාර දේපළ පරිහරණ ක්‍රමවල මූලික ස්වරූපය වටහා ගැනීමට ද ආලෝකයක් ලැබෙනු ඇත.

මෙම අධ්‍යයනයට උපයෝගී කරගත හැකි පැපිළියාන පිළිබඳ ලිපිවලින් තොරතුරු අතින් වඩාත්ම සම්පූර්ණ ලිපිය නම් දැනට පැපිළියාන සුනේත්‍රා මහා දේවි පිරිවෙන් භූමියේ නටබුන් කැබලි එක්කොට ගළපා ඇති ගල් පුවරුවෙහි එන ලිපියයි. මේ ලිපිය පිරිසිදු කොට ශ්‍රීමත් **ඩී. බී. ජයතිලක** විසින් **කතිකාවත් සඟරාවේ** පළකොට තිබේ.[2] මෙය පැපිළියානේ ශිලා ලේඛනය යනුවෙන් සාමාන්‍යයෙන් හැඳින්වේ.

1. පැපිළියාන පිළිබඳවූ මේ ලිපිද සාහිත්‍ය මූලාශ්‍රය තොරතුරුද සංග්‍රහ කොට **පැපිළියානේ සුනේත්‍රා මහා දේවි පිරිවෙනේ ඉතිහාසය** නම් සංක්ෂිප්ත නිබන්ධයක්, **බලගල්ලේ විමලබුද්ධි හිමි** විසින් 1956 ප්‍රකාශයට පත් කොට ඇත. එකී නිබන්ධය කියවීමෙන් මා තුළ හටගත් කුතුහලය මෙම අධ්‍යයනයට මා මෙහෙයවූ ප්‍රධාන ප්‍රබෝධකය බව මෙහිලා සඳහන් කරන්නේ එහි කතුවරයාට කෘතගුණ පූර්වකවය.
2. **කතිකාවත් සඟරා, කස., ඩී. බී. ජයතිලක,** 1955. විද්‍යාලංකාර යන්ත්‍රාලය, 40–43 පිටු.

මෙම ලිපියට යටින් ඒ ලිපියට පරිශිෂ්ටයක් සේ ඊට අවුරුදු 5කට පසුව, එනම් රජුගේ සූසාළිස් වැන්නේ, ක්‍රි.ව. 1459 උඳුවප් පුර විසේනිය දින, නිකුත් කරන ලද තවද සන්නසක් කොටා තිබේ. රජුගේ මවු බිසවුන් වහන්සේට පින් පිණිස නව යොදුන් කෝරළයේ දෙනවක අරමණපළ සාදවන ලද විහාරයට පුදන ලද ගම් බිම් ඇතුළු විහාර ලාභයද සුනේත්‍රා මහා දේවි පිරුවන්පති මංගල තෙර සාමීන්ට දක්ෂිණාකොට ලියා දුන් බව මේ කොටසේ සඳහන් වේ.

පැපිළියාන ගල් පුවරුවේ කොටා ඇති මේ පැපිළියාන ශිලා ලේඛනයට අතිරේකව පැපිළියාන හා සම්බන්ධ තවත් ලිපි කිහිපයක් **එච්. ඩබ්. කොඩ්රිංටන්** විසින් 1926 **විද්‍යොදය ධර්ම ශාස්ත්‍රීය සංග්‍රහයේ** පළ කොට ඇත.[1] තමා විසින් වර්ෂ ගණනකට ප්‍රථම පිටපත් කර ගන්නා ලද ඒ ලිපිවල මුල් පුස්කොළ පිටපත් පිළිබඳ සටහනක්, ලිපි පළ කරවන කාලයේ තමා ළඟ නැතැයිද එහෙයින් ඒවා ශුද්ධ නොකොට තුබූ සේ පළ කළ බවද **කොඩ්රිංටන්** සඳහන් කර තිබේ.[2]

මේ අනුව **කොඩ්රිංටන් විද්‍යොදය ශාස්ත්‍රීය සංග්‍රහයෙහි** පළ කොට ඇති මේ පැපිළි-යාන ලිපිවල සත්‍යාසත්‍යතාව සසඳා බලන්නට අපට අන් කිසිදු සාක්ෂියක් නැත. එසේ වුවද **කොඩ්රිංටන්ම** පවසන්නාක් මෙන් ලිපිවල සත්‍යාසත්‍යතාව එහි අන්තර්ගත කරුණු වලිනුත් ඒවා අන්තර් ගත කොට ඇති රචනා විලාස හා භාෂා විලාසවල ස්වරූපයෙනුත් වටහා ගන්නට අපට සිදුවේ. ඇරත් මේ ලිපි බොහොමයකම කියවෙන ප්‍රධාන තොරතුරු ඉහත සඳහන් කළ පැපිළියානේ ශිලා ලේඛනයේ එන තොරතුරු සමඟ මැනෙවින් ගැළපෙන බවද මෙතැනදී සිහිපත් කළයුතුය. මේ කරුණු සලකා **කොඩ්රිංටන්** ඉදිරිපත් කරන පැපිළියාන ලිපිවල අන්තර්ගත කරුණු බොහෝ සෙයින් ඒ ආකාරයෙන්ම මෙම අධ්‍යයනයට උපයෝගී කරගනු ලැබේ.

පැපිළියානට සම්බන්ධ මේ ලේඛන අපට පහත දැක්වෙන අයුරින් කාලවකවානු අනුව පෙළ ගැස්විය හැකිය.

1. රජුට සොළොස් වැන්නේ, එනම් ක්‍රි.ව. 1431 වර්ෂයේ, පැපිළියාන විහාරයට භාණ්ඩාගාරයෙන් පිදූ මැදිමාල, කුඩ වැලිගම බද වේයංගල්ල, අරුග්ගොඩ, බොල්ලතාව, කෙසෙල්සේනාව යන ගම්වල ඉම් පත්‍රය; මෙය පළමුවැනි ඉම් පත්‍රය යනුවෙන් මෙතැන් සිට හැඳින්වේ.[3]

2. රජුගේ සතළොස් වැන්නේ, එනම් ක්‍රි.ව. 1432, බක් මස පුර පසළොස්වක දින දරන මැදිමාල සන්තක ඉඩම් වට්ටෝරුව;[4] මෙය මින් මතු මැදිමාල ඉඩම් වට්ටෝරුව යනුවෙන් හැඳින්වේ.

3. රජුගේ සතළොස්වැන්නේ, එනම් ක්‍රි.ව. 1432, ඉල් මස පුර දසවක දින දරන, කුඩවැලිගම, පැපිළියාන, මැදිමාල යන ගම්වලින්ද රජුගේ භාණ්ඩාගාරයෙන්ද පුදන ලද පරිවාර ජනයාගේ නම් ලැයිස්තුව.[5] මෙය මින් මතු පිරිවර වට්ටෝරුව යනුවෙන් හැඳින්වේ.

---

1. **විද්‍යොදය, ධර්ම ශාස්ත්‍රීය සංග්‍රහය**, 1 කාණ්ඩය, 8 කලාපය. 1926 , 295-299; 374-375; 416 පිටු.
2. **විද්‍යෝදය**, 1, 295 පිට.
3. **විද්‍යෝදය**, 1, 297-299.
4. **විද්‍යෝදය**, 1, 374-375.
5. **විද්‍යෝදය**, 1, 376-377.

4. රජුගේ 39 වැන්නේ එනම් ක්‍රි.ව. 1454 වැන්නේ මැදින් පුර පසළොස්වක දින පැපිළියාන මැදිමාල ඇතුළු විවිධ තැන්වලින් පූජා කරන ලද ගම් බිම් ද ඒවායේ ආදයම පරිහරණය කරන ආකාරය ද පිළිබඳ ශිලා ලිපිය; මෙය පැපිළියාන ශිලා ලේඛනය[1] යනුවෙන් මින් පසු දක්වේ.

5. රජුගේ සූ සාළිස් වැන්නේ එනම්, ක්‍රි.ව. 1495 උඳුවප් පුර විසේනිය දින කුඩවස ලියදරයරුන් රජුගේ අණින් මහ බිසෝ සාමින්ට පින් පිණිස නවයොදුන් බැද දෙනවක කරවූ අරමණපළ විහාරයට පැපිළියාන සුනේත්‍රා මහා දේවි පිරිවෙන් තෙරසාමින් වඩමවාගෙන වුත් උන්වහන්සේට විහාරය දක්ෂිණෝදක කොට පුද, එම විහාරයේ මතු පැවැත්මට කුඹුරු හා ගරුභාණ්ඩ පූජා කොට, ඒවායේ ආදයම පරිහරණය කළයුතු ආකාරය දක්වමින් කුඩවස ලියදරයරුන් පිහිටුවූ ලිපිය.[2]

6. රජුගේ සූසාළිස් වැන්නේ, එනම් 1459 උඳුවප් පුර විසේනිය දින අරමණපළ විහාරයට අයත් විහාර ලාභය පැපිළියානේ සුනේත්‍රා මහා දේවි පිරිවෙන් තෙර සාමින්ට ලියා දුන් බවට, රජු විසින් නිකුත් කරන ලද සන්නස; මෙය පැපිළියාන ශිලා ලේඛනයේ පරිශිෂ්ටයක් සේ කොටවා ඇත.[3] මෙතැන් සිට එය පැපිළියාන ශිලා ලේඛන පරිශිෂ්ටය යනුවෙන් හැඳින්වේ.

7. රජුගේ පන් සාළිස් වැන්නේ, එනම් ක්‍රි.ව. 1460 පොසොන් පුර තෙළෙස්වක අරමණපළ විහාර සන්තක දේපළ සියල්ල පැපිළියාන විහාරයට අයත්ව පවත්නා ලෙස රජු ජයවර්ධන පුර චිත්‍ර මණ්ඩපයේ සිට නිකුත් කළ ආඥාවෙන් ලියා දුන් සන්නස් පත් කඩ; මෙය අරමණපොළ සනනස් පත් කඩ[4] යනුවෙන් හැඳින්වේ.

8. රජුගේ සොළොස්වැන්නේ සිට සූසාළිස් වැන්න දක්වා, පැපිළියාන විහාරයට නොයෙක් තැනින් පුදන ලද ඉඩ කඩම්වල මායිම් දක්වෙන ඉම් පත්‍රය.[5] මෙය පැපිළියාන දෙවැනි ඉම් පත්‍රය යනුවෙන් මෙතැන් සිට හැඳින්වේ.

## ii. පැපිළියානේ සුනේත්‍රා මහාදේවි පිරිවෙන ඉතිහාසය

පැපිළියාන පැරණි ජයවර්ධනපුරයට යාබදව දකුණින් පිහිටි ගමකි[6] ජයවර්ධනපුර රජ කළ **VI පරාක්‍රමබාහු** රජතුමා සිය මවු බිසව වූ **සුනේත්‍රා මහා දේවි** සිහි වනු පිණිස එතුමියට පින් පිණිස පැපිළියානේ විහාරයක් සාදවන ලදි. එයට සිය මවු බිසවගේ නාමයෙන් **සුනේත්‍රා මහා දේවි පිරිවෙන** යැයි ව්‍යවහාර කොට ඇත.

---

1. **කස.**, 43.
2. **විදොෘදය.**, **ii**, 11–12.
3. **කස.**, 43.
4. **විදොෘදය.**, **ii**, 12.
5. **විදොෘදය.**, **1**, **413–417.**
6. පරෙවි සන්දේශයේ පරෙවියා ජයවර්ධන පුරයෙන් නික්මුණු ඉක්බිති පැමිණියේ පැපිළියාන විහාරයටය. **පරෙවි සන්දේශය**, 49 පද්‍යය.
කොවුල් සන්දේශයේ දෙවිනුවර සිට එන කොවුලා අත්තිඩියෙන් පැපිළියානට වුත් එතැනින්, යටියන, ගල්පොකුණ, සංඝරාජ විහාරය පසුකොට ජයවර්ධනපුර ඇතුළු නුවරට පිවිසෙයි. **කොවුල් සන්දේශය**, 106–120 පද්‍ය.
ගිරා සන්දේශයේ ජයවර්ධනපුර ඇතුළු නුවරින් පිටත්වන ගිරවා සංඝරාජ විහාරය පසුකොට දකුණට ගමන් කොට කෝන් ගහ සෙවණ පසු කළ ඉක්බිති පැපිළියානට පැමිණ ඇත. **ගිරා සන්දේශය**, 58–60, වර්තමානයේ කොළඹට ගිනිකොනින් කොළඹ හොරණ පාරේ 7 වැනි සැතපුම් කණුව අසළ පැපිළියාන හමුවෙයි.

VI පරාක්‍රමබාහුගේ මව සුනේත්‍රා මහා දේවී බවත් පියා ජයමහලැන බවත් ඒ රජුගේ කාලයේ ලියැවුණු සාහිත්‍ය ග්‍රන්ථ දෙකක සඳහන් වෙයි. ඉන් එකක ඇය කාලිංග රාජ වංශයට අයත් බව කියවෙයි[1]. මේ හැර මවුපියන් පිළිබඳ අන් කිසි වැඩි තොරතුරක් මේ රජු සමයේ ලියැවුණු සාහිත්‍ය ග්‍රන්ථවල හෝ ශිලා ලේඛනවල සඳහන් වී නැත.[2]

ඒ රජු කුඩා කල පියා චීනයට අල්ලාගෙන ගිය හෙයින් මව සුනේත්‍රා දේවී කුඩා කුමාරයා රැගෙන විදගම ස්ථවිරයන් ළඟට ගිය බවත්, විදගම තෙරුන් කුමාරයා රහසේ ඇති දැඩි කොට සොළොස් වියට පත්වූ පසු ජනප්‍රධානීන්ට හඳුන්වාදී රයිගම රජ කරවූ බවත් **රාජාවලියේ** එයි[3]. රාජාවලියේ පමණක් එන මේ පුවත බැලූ බැල්මට ප්‍රවාදයක් සේ පෙනේ. රාජාවලියේ රජුගේ පියා වශයෙන් සඳහන් කෙරෙන්නේ චීනයට අල්ලා ගෙන ගිය විජයබාහු නම් රජ කෙනෙකි. රාජාවලියට අනුව චීනයට අල්ලාගෙන ගිය විජයබාහු දඹදෙනියේ පරාක්‍රමබාහු ගෙන් පසු රජවූ විජයබාහුය. මෙය පැහැදිලිවම කාලවකවානු පටලවා ගැනීමකි. චීනයට අල්ලාගෙන යන ලද්දේ VI **පරාක්‍රමබාහු රජුට** පළමුවෙන් රයිගම රජ කළ වීර අලකේශ්වරය. **වීර අලකේශ්වර** සමග ඔහුගේ පවුලේ නෑයන්ද අල්ලාගෙන ගිය බව සඳහන් වන නිසා පරාක්‍රමබාහුගේ පියා ලෙස හැඳින්වෙන ජයමහලැනත් ඔවුන් සමඟ ගෙන යන්නට ඇතැයි අනුමාන කළ හැකිය. එසේ වී නම් මවු සුනේත්‍රා දේවී කුඩා කුමාරයා රැගෙන විදගම තෙරුන් සමීපයට රැකවරණ පතා ගිය බවට රාජාවලියේ එන ප්‍රවාදයේ කිසියම් සත්‍යයක් ඇතැයි සිතිය හැකිය.[4]

VI පරාක්‍රමබාහු රජු මවු බිසවුන්ට පින් පිණිස පැපිළියාන විහාරය කරවා එයට එතුමියගේ නම තබා, නොයෙක් ගම් බිම් කෙත්වත් දැසි දසුන් පුද ඇති ආකාරයත් වාර්ෂිකව මවු බිසව නමින් විශේෂ පූජාවක් පැවැත්විය යුතු බවට නියම කිරීමත් සිහිපත් කරන විට රජ තුළ මවු බිසව කෙරෙහි විශේෂ භක්තියක් හා කෘතඥතාවක් පැවැති බව පැහැදිලි වේ. රජු මවු බිසවුන් කෙරෙහි මෙතරම් අසීමිත භක්තියක් හා කෘතඥතාවක් දැක්වූයේ රාජාවලි ප්‍රවාදයේ දැක්වෙන අයුරු කුඩා කල පියා නොමැතිව අසරණ වූ තමා මැණියන් විසින් දුක සේ හදවඩා ගත් නිසා බවට සැක නැත.

පැපිළියානට කළ ප්‍රථම පූජාව ගැන සඳහන් වන පළමුවැනි ඉම් පත්‍රය නිකුත් කරන ක්‍රි.ව. 1431 වන විටද පැපිළියාන විහාරය ඒ නමින් ප්‍රසිද්ධව පැවතිණි.[5] ඒ නිසා මවු බිසව සිහි කිරීම සඳහා විහාරය ගොඩ නඟන්නට ඇත්තේ රජුගේ සොළොස් වැන්නට ප්‍රථම බව පැහැදිලි වෙයි.

---

1. ''කාලිංග දේශ සංජාත, භූමිපාල කුලෝද්භවා, සුනේත්‍රා නාම දේවී සා, පරාක්‍රම භුජං ප්‍රසූඃ,--,,
**Vrtta ratnakara panchika**, edited by **C. A. Seelakkandha Mahasthavira**, Bombay, 1908, p. 20

''ලමැණි ජයමහ ලැන හිමි සුරතුර වෙළුරන් ලිය යුරු, සුනෙත් මහ දෙවි බිසෝ හිමි ලත් රජ රුවක් සොඳ බුදුකුරු, **පැරකුම්බා සිරිත**, 27 පද්‍යය.

2. හයවැනි පරාක්‍රමබාහුගේ රාජ්‍යෝදයට ප්‍රථම කාලය පිළිබඳ තත්කාලීන සාහිත්‍ය මූලාශ්‍ර ප්‍රදූමාකාර අන්දමේ නිහැඬියාවක් දක්වා ඇත. මේ පිළිබඳව ඇති විවිධ මත ගැන බලන්න.
University of Ceylon, History of Ceylon, UCHC., Vol I, pt, II, pp. 660 - 663.

3. **රාජාවලිය**, සං., **ඒ. වී. සුරවීර**, 1976, 208

4. මේ පිළිබඳව **පරණවිතානගේ** සමාලෝචනය සඳහා බලන්න.
UCHC, I, II, pp. 664–665.

5. ''සිරිසඟබෝ ශ්‍රී පරාක්‍රමබාහු චක්‍රවර්ති ස්වාමීන් වහන්සේට සොළොස්වනු පැපිළියානේ විහාරයට භාණ්ඩාගාරයෙන් පුද වදළ,'' **පළමු ඉම් පත්‍රය, විද්‍යෝදය**, 1, 298.
1908. p. 20

**සද්ධර්ම රත්නාකරය** ලියැවුණේ VI පරාක්‍රමබාහු රජුගේ සත්වැන්නේය. සද්ධර්මරත්නාකර කරු මේ රජුගේ රාජ්‍යෝදය ගණන් ගෙන ඇත්තේ ක්‍රි.ව. 1410 සේය.[1] එහෙයින් සද්ධර්ම රත්නාකරය ලියැවෙන්නේ ක්‍රි.ව. 1417 වැන්නේය. සද්ධර්ම රත්නාකරය ලියැවෙන විටද පැපිළියානේ අභිනව විහාරයද සුනේත්‍රා මහා දේවි පිරි-වෙනද කරවා සංඝයාට පිරිනමා ඇති බව සද්ධර්ම රත්නාකරයේ කියැවේ.[2]

මේ රජු තමාගේ බොහෝ සෙල්ලිපි වල රාජ්‍යෝදය වර්ෂය ලෙස ගෙන ඇත්තේ බු.ව. 1958 හෙවත් ක්‍රි.ව. 1415 ය. මේ රජුගේ රාජ්‍යෝදය වර්ෂය ලෙස ක්‍රි.ව. 1410ත්, 1412 ත්, 1415 ත් යන වර්ෂ තුන විවිධ මූලාශ්‍රයන්හි සඳහන් වී ඇති ආකාරය විමසිල්ලට ලක් කරන පරණවිතාන, වීර අලකේශ්වර 1410 දී චීනයට අල්ලා ගෙන ගිය තැන සිට පරාක්‍රමබාහු තම රාජ්‍යත්වය ප්‍රකාශ කරන්නට ඇතැයිද, ඉන්පසු චීන අධිරාජයාගේ අනුමැතිය ඇතිව දෙවැනි වර ක්‍රි.ව. 1412 දී රයිගමදී රාජ්‍යත්වය ප්‍රකාශ කරන්නට ඇතැයිද, ඉක්බිතිව එවකට ගම්පළ සිටි පරාක්‍රමඇපා පරාජය කොට මුළු ලකට නීත්‍යනුකූල අගරජු සේ 1415 දී ජයවර්ධනපුරයේදී ඔටුණු පළඳින්නට ඇතැයි ද පෙන්වා දෙයි.[3] මෙසේ අවස්ථා තුනකදී රාජත්වය ප්‍රකාශ කිරීමෙන් වැටහෙන්නේ 1415 ජයවර්ධනපුර රජ වන තෙක් ඔහුට රාජත්වයට අභියෝග පැවති බවයි. එහෙයින් ඒ කාලය තුළ පැපිළියාන විහාරය කරවීමට තරම් සහනසීලි වාතාවරණයක් ඔහුට තිබිණැයි සිතිය නොහැකිය.

සද්ධර්ම රත්නාකරය ලියැවෙන ක්‍රි.ව. 1417 වන විට පැපිළියානේ සුනේත්‍රා මහා දේවි පිරිවෙන අභිනවයෙන් කරවා තුබූ බව ඉහත දුටුමු. ඒ අනුව අපට සිතාගත හැක්කේ VI පරාක්‍රමබාහු රජ තම මව සිහිවනු සඳහා පැපිළියානේ සුනේත්‍රා මහා දේවි පිරිවන කරවා ඇත්තේ ක්‍රි.ව. 1415ත් 1417 ත් අතර කාලයක බවය.

මින් පෙනී යන්නේ VI වැනි පරාක්‍රමබාහු මුළු රටට අගරජු වශයෙන් ක්‍රි.ව. 1415 ජයවර්ධනපුර රජවූ අළුතම මවු බිසව සිහිවීම සඳහා පැපිළියානේ විහාරය කරවූ බවකි. එනිසා මවු බිසව ස්වර්ගස්ථ වන්නට ඇත්තේද ඒ අළුතම විය යුතුය. ඒ අනුව රාජාවලි ප්‍රවාදයෙන් කියැවෙන්නා සේ VI පරාක්‍රමබාහු රාජ්‍ය ශ්‍රීයට පත් වන්නට පළමු දුෂ්කර කාලයේ මවගේ රැකවරණ ලබමින් සිටියහයි ද එහෙයින් රජවූ පසු මවු ගැන දැඩි සෙනෙහසකින් හා කෘතඥතාවකින් යුතුව මවුට පින් පිණිස එතුමියගේ නමින් පැපිළි-යානේ සුනේත්‍රා මහා දේවි පිරිවෙන සැදවූහයිද සිතිය හැකිය.

ස්වර්ගස්ථ වූ මවු බිසව වෙනුවෙන් පැපිළියානේ අභිනවයෙන් විහාරයක් කරවන ලෙසට යොදවා ඇත්තේ සිකුරා මුදල් පොතුන් නැමැත්තෙකි. ඔහු රාණී වාසල කාර්ය-යෙහි නියුක්ත පුද්ගලයා බව සඳහන් වෙයි.[4] රාණී වාසල කාරිය යනු බිසෝ මාලිගයේ

1. බුද්ධ වර්ෂයෙන් එක්වා දහස් නවසිය තෙපණස් හවුරුද්දකින් පිරුණු සඳ................ ජයවර්ධන පුරවරයෙහි................රජසිරි පැමිණි................පරාක්‍රමබාහු මහ රජාණන්ට සත් වැන්නෙහි ................ධම්ම දින්නාචරිය විමල කීර්ති මහා ස්ථවිර පාදයෝ................සද්ධර්මරත්නාකර නම්වූ ධර්ම ප්‍රකරණයක් ගෙන හැර දක්වති. **සද්ධර්ම රත්නාකරය, සරක**, සං, **කලපළුවාවේ ශ්‍රී සුගුණසාර දේවානන්ද ස්ථවිර**, කොළඹ, 1955, 75. 76 පිටු.

   එහෙත් මෙම කතුවරයාම තම ග්‍රන්ථයේ දොළොස්වැනි පරිච්ඡේදයේ පරාක්‍රමබාහු ඇපාණන්ට ඉක්බිති බුද්ධවර්ෂ 1958 වැන්නේ, එනම් ක්‍රි.ව. 1415 පරාක්‍රමබාහු රජ වූ බව සඳහන් කොට ඇත. **සරක.** 317.
2. ''පැපිළියානෙහි අභිනවයෙන් භූමිය සකස් කොට ප්‍රාකාර ගොපුර සංඝාරාම බෝධිඝර මණ්ඩපාදීන් විසිතුරු කොට ද්විභූමක ප්‍රතිමා ගෘහයක් කරවා එහි ස්වකීය මාතෘ නාමයෙන් අමුතු පිරිවෙනක් අස්වා,'' **සරක**., 320.
3. UCHC, I, II, 669
4. **කස**., 40.

කටයුතු ලෙස පිළිගැනී ඇත.[1] මුදල් පොතුන් යනු භාණ්ඩාගාරයේ මුදල් ගණන් තබන නිලධාරියා යන අරුත් දෙයි. මේ අනුව පෙනී යන්නේ බිසෝ මාලිගයේ වියදම් කටයුතු භාරව සිටි භාණ්ඩාගාර නිලධාරියාට මවු බිසව වෙනුවෙන් අභිනවයෙන් විහාරයක් ගොඩ නැගීමේ කාරිය රජු විසින් භාර කොට ඇති බවය.

පැපිළියානට කරවූ පළමු පූජාවේ සඳහන් කළතොට බද්දෙන් පිදුණු අරුග්ගොඩ විලට මායිම් කියද්දී උතුරු දිග මායිමට නම් කොට ඇති ඇළ කප්පවන ලද්දේ සිකුරා මුදල් පොතුන්ය.[2] රජුගේ සිවුසාළිස් වැන්නට පසු දෙන ලදැයි ඉහත සලකා බැලූ දෙවැනි ඉම් පත්‍රයේ මැදිමාලේ දකුණු මායිමේ ලකුණක් වශයෙන් සිකුරා පතියාගේ ගෙදෙර දෙරකඩ සිටුවූ ටැඹක් සඳහන් වෙයි.[3] මේ සිකුරාපතියා ඉහත දුටු සිකුරා මුදල් පොතුන් නම් ඔහුගේ නිවස පිහිටා තිබුණේ මැදිමාලේ දකුණු මායිමේ එනම් පැපිළියානට බොහෝ ආසන්නයේ බව පෙනෙයි.

අභිනව විහාරය සඳහා රජු තම භාණ්ඩාගාරයෙන් විසිපන්දහසක් ධනය වියදම්කොට ඇත. මෙම විහාරය ප්‍රාකාර ගෝපුර, ප්‍රතිමා මණ්ඩප, බෝධි, චෛත්‍ය, සංඝාවාස, දේවාලය, පුස්තකාලය, පුෂ්පාරාම, ඵලාරාම යනාදී විහාරාංගවලින් සමන්විතව කරවා ඇත.[4] පැපිළියාන විහාරය තුන් බෝධි පිහිටුවා කළ බව **රාජ රත්නාකරයේද** සඳහන් වෙයි.[5] තුන් බෝධියෙන් එකක් වූ ප්‍රතිමා ගෘහය දෙමහල් කොට කරවන ලද්දකි.[6] පිළිමගෙහි නාථ මෛත්‍රී බෝසතුන් විශේෂ පූජා ලබන තරම්ම ප්‍රමුඛස්ථානයක වූ බව පෙනේ.

## පිරිවෙන් තෙර සාමි

VI පරාක්‍රමබාහු රජතුමා ක්‍රි.ව. 1417 වන විට, එනම් ජයවර්ධනපුරයේ ඔටුණු පැළඳ අවුරුදු දෙසක් ඇතුළත මවු බිසවට පින් පිණිස පැපිළියානේ අංග සම්පූර්ණ කොට ගොඩ නැංවූ විහාරයට ප්‍රථම නායකත්වයට පැමිණි භික්ෂූන් වහන්සේ පිළිබඳව පැපිළියානේ ශිලා ලේඛනයෙන් තොරතුරක් ලැබෙයි. එහි මීට අදාළ පාඨය කියැවෙන්නේ **''පළමුයෙන් මවු බිසෝ සාමින්ගේ ශ්‍රී නාමයෙන් සුනේත්‍රා මහා දේවි පිරිවෙන් අස්වා මෙහි විහාරයට නායකව පැමිණි ගලතුරු මුළ මේධංකර මහතෙර සාමින්ගේ ශිෂ්‍ය නිශ්‍රයෙන් මුක්ත මංගල සාමින්ට සුනේත්‍රා මහා දේවි පිරිවෙන් අස්වා''** යනුවෙනි.[7] මෙහි ''මවු බිසෝ සාමින්ගේ ශ්‍රී නාමයෙන් සුනේත්‍රා මහා දේවි පිරිවෙන් අස්වා මෙම විහාරයට නායකව පැමිණි'' යන්න විශේෂණ වන්නේ ගලතුරුමුළ මේධංකර මහතෙර සාමින්ටද, නො එසේ නම් එතුමාගේ ශිෂ්‍ය නිශ්‍රයෙන් මුක්ත මංගල සාමින්ටදැයි බැලූ බැල්මට වටහා ගත නොහැක. ඒ දෙවැනිව කියවෙන මංගල තෙර සාමින්ට නම් ගලතුරු මුළ මේධංකර මහා ස්ථවිරයන්ගේ සම්බන්ධය මෙතැන ඉදිරිපත් කරන්නේ ඇයිදැයි පැහැදිලි නැත.

1. **කොඩ්රිංටන්, විද්‍යෝදය**, 1, 296.
   **ජයතිලක, කස.** 10, මේ යුගයේ ශ්‍රී ලංකාවේ රාණී යන වචනය යෙදී ඇති වෙනත් ස්ථානයක් මෙතෙක් අපට හමුව නැත. රාජිනි>රජිනි>රැයිණි>රාණී යනුවෙන් සැකසී ආ හැකිය.
2. ප්‍රථම ඉම් පත්‍රය, **විද්‍යෝදය**, 1, 299.
3. දෙවැනි ඉම් පත්‍රය, **විද්‍යෝදය**, 1, 413.
4. **කස.**, 40.
5. **රාජරත්නාකරය, සයිමන් ද සිල්වා**, සං., 1907, 46.
6. සරක., 320.
7. කස., 41.

පාඨයේ දෙවැනි කොටස වන ''නිශ්‍රයෙන් මුක්ත මංගල සාමීන්ට සුනේත්‍රා මහා දේවි පිරිවෙන් තෙර අස්වා'' යන්නෙන් පැහැදිලිවම කියැවෙන්නේ මංගල සාමීන්ට සුනේත්‍රා මහා දේවි පිරිවෙන් පති පදවිය පිරිණැමූ බවකි. එසේ පිරිණැමෙන්නේ ලිපිය පිහිටුවන රජුගේ එකුන් සාළිස් වැන්නේය. එනම් ක්‍රි.ව. 1454 දිය. එසේ ක්‍රි.ව. 1454 වැන්නේ පිරිවෙන් පති පදවිය පිරිණැමෙන විට මංගල සාමීන් නිශ්‍රයෙන් මුක්ත බව විශේෂයෙන් සඳහන් වේ. කිසියම් භික්ෂුවක් නිශ්‍රය මුක්ත වන්නේ උපසම්පදාවෙන් පසු වසර පහක් උපාධ්‍යායයන් ආශ්‍රයේ හෙවත් නිශ්‍රයේ කල්ගත කිරීමෙන් පසුවය. උප-සම්පදාව ලැබිය හැකි අවම සීමාව වයස විස්සය. එහෙයින් නිශ්‍රය මුක්ත විය හැකි අවම සීමාව වයස විසිහයයි. මින් අදහස් වන්නේ සුනේත්‍රා මහා දේවි පිරුවන් පති පදවිය පිරිණැමුණු ක්‍රි.ව. 1454 වැන්න වන විට මංගල සාමින් යටත් පිරිසෙයින් වයස විසිහය වැන්නේ සිටි බවය.

පැපිළියානේ ශිලා ලේඛන පරිශිෂ්ටය රජුගේ සූසාළිස් වැන්නේ, එනම් මුල් ලිපියට හරියට වසර පහකට පසු, පිහිටුවන ලද්දකි. "මුල් ලිපියේ 'මංගල සාමීන්'' යනුවෙන් හැඳින්වුණු උන්වහන්සේ පරිශිෂ්ටයේ, මංගල තෙර සාමීන්'' යනුවෙන් හඳුන්වා ඇති බව මෙහිදී සිහිපත් කළයුතුය. ඉන් අදහස් වන්නේ ඒ වන විට උන්වහන්සේ නිශ්‍රය මුක්ත වසර පහක් ගෙවා ස්ථවිර තත්වය ලබා සිටි බවකි. එනම් යටත් පිරිසෙයින් තිස් එක් වැනි වියේ සිටි බවකි.[1]

පැපිළියාන ලිපිය පිහිටුවන ක්‍රි.ව. 1454 වන විට මංගල සාමි නිශ්‍රය මුක්ත තත්වයේ, එනම් වයස 26 වැන්න තරමේ, සිටි කෙනෙකැයි සිතන විට ඉහත දැක්වුණ පාඨයේ **පළමුවෙන් මෙම විහාරයට නායකව පැමිණි** යන්න උන්වහන්සේ සඳහා යෙදුණු විශේෂණයකැයි ගන්නට ඉඩක් නැත. මන්ද යත්, පැපිළියානේ අභිනව විහාරය ක්‍රි.ව. 1417 වන විටත් නිමවා තුබුණු හෙයින් අභිනව විහාරයට නායක තෙරවරයකු 1417 වන විටත් පත්ව සිටියහයි සිතිය යුතු නිසාය. 1454 වැන්නේ, විසිහය වැනි විය තරමේ සිටි මංගල සාමි 1417 වන විට ඉපදිලාවත් නැතැයි සිතන්නට සිදුවේ. එහෙයින් අදළ පාඨයේ මුල් කොටස විශේෂණ වන්නේ මංගල සාමීන්ට නොව උන්වහන්සේගේ ආචාර්ය ගලතුරු මූළ මේධංකර මහතෙර සාමීන්ට යැයි නිසැකව තීරණය කළ හැකිය. ''පළමුවෙන් මහ බිසෝ සාමින්ගෙ ශ්‍රී නාමයෙන් සුනේත්‍රා මහා දේවි පිරිවෙන් අස්වා මෙමම විහාරයට නායකව පැමිණි'' යන පාඨයෙන් අදහස් වන්නේ රජු ස්වර්ගස්ථවූ මවු බිසවට පින් පිණිස පැපිළියානේ අභිනවයෙන් කළ විහාරය මවු බිසවගේ ශ්‍රී නාමයෙන් ''සුනේත්‍රා මහා දේවි පිරිවෙන'' යනුවෙන් නම් කළ බවකි. එසේ නම් කොට ඇත්තේ එකී විහාරයේ ප්‍රථම නායකත්වයට පැමිණි ගලතුරු මූළ මේධංකර මහ තෙර සාමින් විසින් බව ඒ පාඨයෙන් වැටහෙයි. ඒ අනුව 1417 තරමේ සිට සුනේත්‍රා මහා දේවි පිරිවෙන් පති පදවිය උසුලන ලද්දේ එතුමන් විසිනැයි සිතිය යුතුය.

පැපිළියානේ ලේඛනයෙන් කියැවෙන ආකාරයට සුනේත්‍රා මහා දේවි පිරිවෙන් පති පදවිය මංගල සාමීන්ට පැවරෙන්නේ එම ලිපිය පිහිටුවූ ක්‍රි.ව. 1454 වැන්නේය. ඒ අනුව සිතන විට ක්‍රි.ව. 1417 සිට 1454 වැන්න වන තෙක් සුනේත්‍රා මහා දේවි පිරිවෙන් පති පදවිය උසුලා ඇත්තේ පළමුයෙන් විහාරයේ නායකත්වයට පැමිණි ගල්තුරු මූළ

1. ස්ථවිර සම්මුතිය ලැබිය හැක්කේ නිශ්‍රය මුක්ත සම්මුතියෙන් පසු තෙර බණ ටීකා සහිතව උගෙන පස් අවුරුද්දක් ගතවූ තැන්හිය, දඹදෙනි කතිකාවත, කය., 11.

මේධංකර මහාස්ථවිරයන් බව පිළිගන්නට සිදුවේ. මෙතුමා තොටගමු විහාරාධිපතිව සිටියහයි ද පැපිළියාන විහාරයේ නායකත්වයට පැමිණියේ තොටගමු විහාරයේ සිට විය හැකැයිද අප විසින් වෙනත් තැනක සාක්ෂි ඉදිරිපත් කොට පෙන්වා දී ඇත.[1]

ක්‍රි ව. 1454 වන විට එතුමා මහාස්ථවිර තත්වයේ සිටි බව කියැවේ. මහා ස්ථවිර පදවිය පිළිබඳව **දඹදෙණි කතිකාවතේ** පැණවුණු නියමය මේ වකවානුව වන තෙක් ව්‍යවහාරයේ පැවතිණි නම්, එතුමා එවකට මේ රටේ සිටි ග්‍රාමවාස මහාස්ථවිර වනවාස මහා ස්ථවිර යන දෙදෙනාගෙන් එක් අයකු බව පිළිගන්නට සිදුවේ.[2] එතුමා ගලතුරු මූළ යනුවෙන් හඳුන්වා ඇත. ගලතුරු මූළ ග්‍රාමවාසයට අයත් මූලයකි. එහෙයින් එතුමා එවකට ග්‍රාමවාස මහාස්ථවිර පදවිය ඉසිලූහයි ද සිතිය හැකිය.

එතුමාට විශේෂ වශයෙන් යෙදී ඇති ගලතුරු මූළ යන විශේෂණය සලකා බලන විට එතුමා ගලතුරු මූළ අධිපති තනතුර ඉසුලූහයි පිළිගන්නට සිදුවේ. ගලතුරු මූළ පොළොන්නරු යුගය තරමේ සිට ලංකාවේ ප්‍රකටව පැවති මූල හෙවත් ආයතන අටෙන් එකකි. ශෛලාන්තරායතනය යනුවෙන්ද මෙය හැඳින්වේ.[3] දඹදෙණි කතිකාවතට අනුව මූලාධිපති පදවියටද මහාස්ථවිර පදවියටද තුන් සිංහලයේ සංඝයාගේ සම්මුතියද රාජ සම්මුතියද අවශ්‍යය.[4] ඒ ව්‍යවහාරය මෙ වකද පැවතියේ නම් පැපිළියානේ සුනේත්‍රා මහා දේවි පිරිවෙන් පතින් වහන්සේ ගලතුරු මූලාධිපති වශයෙන්ද, ග්‍රාමවාස මහාස්ථවිර වශයෙන්ද මුළු ලක්දිව සංඝයාගේද රජුගේද සම්මුතියෙන් පත්වී ඇති බව පිළිගන්නට සිදු වේ.

උන්වහන්සේ දැරූ මේ තත්වය නිසා පැපිළියානේ සුනේත්‍රා මහා දේවි පිරිවෙන යටත් පිරිසෙයින් ක්‍රි.ව. 1454 තරම් වන විට VI පරාක්‍රමබාහු රජුගේ පමණක් නොව මුළු ලක්දිව සංඝයාගේද අවධානයට ලක්වූ සුවිශේෂ ආයතනයක් ව පැවැතිණ. දඹදෙණි කතිකාවත් ව්‍යවහාරයට අනුව මාහිමි හෙවත් සංඝ රාජ තනතුර පුරප්පාඩු වූ අවස්ථාවකදී එම තනතුරට පත්වන්නේ මහා ස්ථවිර දෙපොළගෙන් එක් නමකි.[5] ඒ අනුව බලන විට පැපිළියානේ සුනේත්‍රා මහා දේවි පිරිවෙනේ ප්‍රථම අධිපති ගලතුරු මූළ මේධංකර මහාස්ථවිරයන් වහන්සේ එවකට මාහිමි පදවියට පත්වීමටද සුදුසුකම් ලබා සිටි කෙනෙකි. ජයවර්ධනපුර යුගයේ මාහිමි සංඝරාජ පරපුර පිළිබඳ අප විසින් කරන ලද පර්යේෂණයකදී ඇත්ත වශයෙන් මුන් වහන්සේ පරාක්‍රමබාහු රාජ්‍ය සමයේ අවසාන භාගයේ වර්ෂ කිහිපයක් සංඝරාජ පදවිය හෙබවූ බවට සාක්ෂි එළිදරවු වී ඇත.[6]

ගලතුරු මූළ මේධංකර මහාස්ථවිරයන් වහන්සේ නිසා පැපිළියානේ සුනේත්‍රා මහා දේවි පිරිවෙන ප්‍රසිද්ධියට පත් වන්නට ඇති ආකාරය ඉහත සලකා බැලූමු. දඹදෙණි කතිකාවත "මා තෙරුන් මුල නැදි පිරිවෙන් ආදිය" ගැන සඳහන් කොට ඒවා බලවත්

1. **මැන්දිස් රෝහණදීර, ජයවර්ධන පුර සංඝ රාජ පරපුර,** 1978, 26, 27 පිටු.
2. දඹදෙනි කතිකාවතට අනුව ග්‍රාම වාසයේ මහාස්ථවිර හා වන වාසයේ මහා ස්ථවිර හැර වෙනත් මහා ස්ථවිර කෙනකු සිටිය නොහැකිය. බහු නායකත්වය නම් ශාසන විලොපනයට ඒකාන්ත හේතු බැවින් මේ මහතෙර දෙතෙන මුත් අන් කිසියම්ව තෙනක් මහතෙර නොකටයුතු; **දඹදෙනි කතිකාවත; කස.,** 13.
3. වැඩි විස්තර සඳහා කියවන්න. **මැන්දිස් රෝහණදීර, ශ්‍රී ලංකාවේ සංඝ සංවිධානය,** මධ්‍යතන යුගය, 1974, 207, 208 පිටු.
4. **කස.,** 13.
5. "මාහිමි තෙන අයාමෙක වුවමනා වී නම් මේ දෙතෙනින්ම යෙදෙන තෙනක් එලෙසින් මා හිමි කටයුතු; **කස.,** 13.
6. **මැන්දිස් රෝහණදීර, ජයවර්ධන පුර සංඝ රාජ පරපුර,** 1978, 13–34 පිටු.

පිරිවෙන් වශයෙන් හඳුන්වාදී ඇත. වචනාර්ථ ගත් කල්හි ''මා තෙරුන් මුළ නැඳි පිරිවෙන්'' යනු ''මහාස්ථවිරයන්ගේ මුළට හෙවත් මහාස්ථවිරයන් අයත් මූලයට නතු පිරිවෙන්'' යන අදහසය. එසේ බලන කල්හි පැපිළියානේ සුනේත්‍රා මහා දේවි පිරිවෙන මහාස්ථවිරයන්ගේ මූලයට හෙවත් ගලතුරු මූළට නතුය. එහෙයින් එයද බලවත් පිරිවෙනකි. හෙවත් ප්‍රබල පිරිවෙනකි. මා තෙරුන් මුළ නැඳි ඒ බලවත් පිරිවෙන් වලටද නායකයන් පත් කිරීමේදී එයට සංඝ සම්මුති රාජ සම්මුති දෙකම අවශ්‍යය.[1]

එසේ පත් කිරිමේදී ශික්ෂිත තෙර තනතුරු පත් කෙනකුන් නොවුවද නිශ්‍රය මුක්ත නම් මුළ හෙවත් මූලාධිපතිවරයා කැමැති නම් එබඳු බලවත් පිරිවෙනක අධිපති වශයෙන් පත් කළ හැකිය. එසේ වුවද ඔහු සංගමු ගණවැසි ගම්හි අඛණ්ඩ සන්තතින් හෙවත් අඛණ්ඩ පරපුරෙන් ආ කෙනකු විය යුතු බව කතිකාවත් නියමයයි.[2]

මේ අනුව රජුගේ එකුන් සාළිස් වැන්නේ, එනම් ක්‍රි ව. 1454 දී මා තෙරුන් මුළ නැඳි බලවත් පිරිවෙනක්වූ පැපිළියානේ සුනේත්‍රා මහා දේවි පිරිවෙනට නායක වශයෙන් මංගල සාමීන් පත් කර ඇත්තේ ඉහතකී කතිකාවත් නියමයන්ට බෙහෙවින් අනුකූල වන අයුරින්යයි සිතේ. උන්වහන්සේ ස්ථවිර නොවුවද, නිශ්‍රය මුක්ත සුදුසුකම තිබුණි. උන්වහන්සේගේ ආචාර්යවූ ගලතුරුමූල අධිපති මේධංකර මහාස්ථවිර තුමාගේ කැමැත්ත උන්වහන්සේට නොඅඩුව ලැබෙන්නට ඇත. සංඝ සම්මුතිය හා රාජ සම්මුතිය උන් වහන්සේට ලැබෙන්නට ඇත. සවිස්තරව පැහැදිලි කිරිමට තරම් සාක්ෂි නැතද උන් වහන්සේ සංගමු ගණවැසි ගම්වල අඛණ්ඩ පරම්පරාවෙන් පැවත ආ කෙනකු විය හැකිය.

උන්වහන්සේ නිසාද සුනේත්‍රා මහා දේවි පිරිවෙනට විශාල ප්‍රසිද්ධියක් ලැබුණු බව පෙනේ. එතුමා නිසැක වශයෙන්ම VI පරාක්‍රමබාහුගේ බලවත් ප්‍රසාදයට ලක්වී සිටි කෙනෙකි. එතුමා පසු කලක එනම් ක්‍රි ව. 148? දැලේ වකවානුවක සංඝ රාජ තනතුරටද පත්ව සිටි බවට අප විසින් වෙනත් තැනක සාක්ෂි එළවා ඇත.[3] මේ ආකාරයෙන් සලකා බලන විට 15 සියවසේ සංඝරාජ පදවිය තෙක් උසස් වීම් ලද සුප්‍රකට ස්ථවිරයන් දෙදෙනකුගේ නායකත්වය නිසා සුනේත්‍රා මහා දේවි පිරිවෙන 15 සියවස තුළ බෙහෙවින් ප්‍රබල ප්‍රකට ආගමික සිද්ධස්ථානයක්ව පැවති බව පෙනේ.

## III. සුනේත්‍රා මහා දේවි පිරිවෙන සන්තක දේපල

පිරිවෙනේ අනාගත පැවැත්ම සඳහා රජු විසින් බොහෝ ගම් බිම් පූජා කොට තිබේ.[4] සුනේත්‍රා මහා දේවි පිරිවෙන ආරම්භයේ සිට යටත් පිරිසෙයින් ක්‍රි.ව. 1459 වර්ෂය තෙක් මේ ආකාරයෙන් පුදනලද ගම් බිම් ඉඩකඩම් දාසි දස් ඇතුළු දේපල ව්‍යාප්තවී ගිය ආකාරය පැපිළියාන ලිපිවලින් සොයා ගත හැකිය.

රජුගේ සොළොස් වැන්නේ, එනම් ක්‍රි ව. 1431 ඉම් පත්‍රයෙන් පැපිළියානේ විහාරයට භාණ්ඩාගාරයෙන් පූජා කළ, පැපිළියානට යාබද මැදිමාල, පස්යොදුන් රට කුඩවැලිගමට ඇතුළත්වූ වේයංගල්ල, අරුග්ගොඩවිල, බොල්ලතාව, කෙසෙල්හේනාව යන ගම්

1. මා තෙරුන් මුළ නැඳි පිරිවෙන් ආදි වූ බලවත් පිරිවෙනටද සංඝ සම්මුති රාජ සම්මුතින්ම තැබිය යුතුය, **කස.**, 13.
2. **කස.**, 13.
3. **ජයවර්ධනපුර**........., 45–52.
4. **රාජරත්නාකරය,** 43 පිට.

සතර මායිම් වෙන් කොට දී ඇත. මැදිමාලට මායිම් දැක්වීමේදී "නැගෙනහිර දිශාවට වෙල් මැද මීදෙල්ල වැට හා මෙම දිගින් බඩබද්ද" යනුවෙන් මායිම් ලකුණු කියා ඉක්බිති ගිනිකොණ දිගටද දකුණු දිගටද බස්නාහිරටද උතුරටද යන වශයෙන් මායිම් කියා ඇත. මායිම් දැක්වීමේදී බොහෝ විට ස්වාභාවිකව පිහිටා තුබූ ගල් හා වළවල්, ගස්, තුඹස් ආදියද සඳහන් කොට ඇත. නිදසුන් වශයෙන් මැදිමාලට උතුරු දිගට මායිම් පේළිය වශයෙන් යෝඹුවල, කසටගස, කුරුගුලාගල, අතළගල, ගල්ටැඹ, සෙණගැසූ දෙල්ගස, සිරිවෙළලුවාගේ ගෙපළ, බක්මීගස, පල්ලේ කඩවල, සතරැස් පොකුණ, ගල්ටැඹ, මීදෙල්ලවැට වශයෙන් දක්වා ඇත. මැදිමාලට, බටහිරට මූදතෙර හා දියබස්නා කඩ දක්වා ඇත.[1] ආරම්භයේ මෙසේ දී ඇති ගස් තුඹස් ආදි බොහෝ කල් නොපවත්නා මායිම් ලකුණු පසු කලකදී ගල්ටැඹ පිහිටුවා ස්ථිර කොට ඇත. මීට පසු කලක නිකුත් කරන ලදැයි සිතිය හැකි දෙවැනි ඉම් පත්‍රයේ මැදිමාල උතුරු දිග ඉහත දුටු මායිම්, යෝඹුවල සිටුවූ ටැඹ, කසටගස් බඩ ටැඹ, සුඹස් ගොඩ, කුරුගලාගල, අතළගල, පොතුවල සිටුවූ ටැඹ, සිරි වෙළලුවාගේ ගෙපළ ටැඹ, කොළඹ යන අත්මහ හා සතරැස් පොකුණ යන වශයෙන් බොහෝ සෙයින් ස්ථිර මායිම් බවට පත් කොට තිබේ.[2]

ඊළඟ වර්ෂයේ, එනම් රජුගේ 17 වැන්නේ, ක්‍රි.ව. 1433 බක් පුර පසළොස්වක් දින මැදිමාල ගමට අයත් කුඹුරු ඕවිටි, දෙණි යන මේවා ඒවා වගා කළ පුද්ගලයන්ගේ නම් යටතේ ඒවායේ විශාලත්වය සමග ලැයිස්තුවක් වශයෙන් ප්‍රකාශ කොට තිබේ.[3] කුඹුරු වර්ග තුනකට දක්වා ඇත. උත්තේ තරමින්, මැද්දේ තරමින් හා පැස්සේ තරමින් යනුවෙනි. මේ තුන් තරමින් කුඹුරු දැක්වීම පොළොන්නරු යුගයේද බැවහරයේ තිබුණු බැව් **නිශ්ශංකමල්ලගේ ගල්පොත ලිපියෙන්** එළිදරව් වේ. එනම කුඹුරේ ජලය බෙදී යාම අනුව සරු සාරත්වය අඩු වැඩි බිම් කොටස් මේ අයුරින් වෙන් කොට ව්‍යවහාර විණැයි සිතිය හැකිය. ඒ අනුව උත්තේ තරම යනු බෙහෙවින් සරුසාර වළ ලියදි සහිත කොටසලෙසද, මැද්දේ තරම යනු ඊළඟට සරුසාර කොටස ලෙසද, පැස්සේ තරම යනු සරුසාරත්වයෙන් තුන්වැනි තැනට වනගොඩ ලියදි කොටසද ලෙසද සැලකිය හැකිය.[4]

මේ කුඹුරු ලැයිස්තුවේ සඳහන් වන ආකාරයට මැදිමාල තුළ කුඹුරු බොහෝ කොට පිහිටා තිබුණේ කළුබෝවිල[5] හා මඩවල යන වෙල්යායවල බව පෙනේ. මේ ආකාරයෙන් ප්‍රකාශයට පත් කළ මැදිමාල සන්තක තුන් තරමේ කුඹුරු විවිධ දෙණි අත්මං යන ඉඩම්-වල මුළු ප්‍රමාණය යාල් එකයි අමුණු පහළොහයි පැල් දෙකයි ලාස් හතක් වේ.[6]

කල් යත්ම පැපිළියාන අවට තවද ගම් පූජා කර ඇත. රජුගේ එකුන්සාළිස් වැන්න වන විට පැපිළියානට හා මැදිමාලට අමතරව යාබද දිවුල්පිටියෙන්[7] වේල්ලෙන් හා උඩදෙනියෙන් අමුණු දහයක බිම් ප්‍රමාණයක් පුද ඇත. තවද නිකපය ගමද මේ වන විට පැපිළියාන පිරිවෙනට වටනාපස සඳහා පූජා කොට තිබිණ.[8] රජුගේ සොළොස් වැන්නේ, හෙවත් ක්‍රි.ව. 1431 පළමු වැනි ඉම් පත්‍රයේ මැදිමාලට දක්වා තිබූ මායිම්

1. පළමු ඉම්පත්‍රය. **විද්‍යෝදය**, 1, 297. මැදිමාල යනු වර්තමානයේ පැපිළියානට යාබදව බටහිරින් පිහිටා ඇති නැදිමාලයි.
2. දෙවැනි ඉම් පත්‍රය, **විද්‍යෝදය**, 1; 414.
3. මැදිමාල ඉඩම් වට්ටෝරුව, **විද්‍යෝදය**, 1; 374,375.
4. මේ පිළිබඳ වැඩි විස්තර සඳහා බලන්න. **EZ., II**, 117.
5. වර්තමාන කළුබෝවිල පැපිළියානට යාබදව වයඹ දිගින් පිහිටා ඇත.
6. මැදිමාල ඉඩම් වට්ටෝරුව, **විද්‍යෝදය**, 1, 375.
7. වර්තමාන පැපිළියානේ කොටසකි.
8. **කස.**, 43, වර්තමානයේ නිකපේ යනුවෙන් ව්‍යවහාර වේ. පැපිළියානට හා නැදිමාලට යාබද ගම්මකි·

1454 වැන්න වන විට ව්‍යාප්ත ව ඇති බව දෙවැනි ඉම් පත්‍රය විමසන විට පෙනේ. මුලින් මැදිමාලේ බටහිර දිසාවේ මායිම් පේළිය උතුරේ සිට දකුණට මුදු ගල්වැටට හා මුදු තෙරට පමණක් සීමාවිය[1] දැන් 1454 තරම වන විට මුදු තෙරට අතිරේකව දකුණට විහිදුණු මායිම් පේළියක් ද ඇතුළත්ව තිබේ. පල්ලියගාවා පොකුණු ඉවුරේ වැඹ, තුංමං සන්දියේ අම්බලම, තන්තිරියාගේ ගෙදර බඩ වැඹ, මාවත බඩ ගල, කෙසියන් ගැසූගල, වැල්ලට යන මාවත ඇතුළු පොකුණබඩ වැඹ, තුන් ඉමට සිටුවූ වැඹ, නියරගාවා වැඹ, පල්ලි දෙරට ඉම රුක්ගස, අතුරු වීදියේ කවුඩානට ඉම සිටුවූ වැඹ යන වශයෙනි.[2] මේ හේතු කොට ගෙන පළමු ඉම් පත්‍රයේ දකුණු දිසාවට තුබූ මායිම් පේළිය දෙවැනි ඉම් පත්‍රය දෙන වකවානුවේ මුළු මනින්ම වෙනස් වී ඇත. මින් හැඟි යන්නේ 1454 තරම් කාලය වන විට නැදිමාල ගමට යාබදව දකුණින් තවද ඉඩම් සැලකිය යුතු ප්‍රමාණයකින් මැදිමාලට අයත් කොට විහාරයට පූජා කර ඇති බවකි.

1431 වැන්නේ පස්යොදුන් කෝරළයෙන් දී තිබූ කුඩවැලිගමට ඇතුළත් ගම්වල ගොඩ මඩ ඉඩම් ප්‍රමාණය 1454 පැපිළියාන ලිපියෙන් යාල් අමුණු වශයෙන් නිශ්චය කොට දක්වා ඇත. 1454 දී සියනෑ කෝරළයෙන් ගිරිදෙරද, බෙලිගල් නුවර මංගෙදරින්ද දෙළොස්දහස් රට මැදගොඩ මැඩලෙන්ද, යන මේ තැන්වලින් ගොඩින් අමුණු පහක් හා මඩින් කුඹුරු බිජුවට අමුණු සතක්ද පුද ඇත.[3]

රජුගේ සිවුසාළිස් වැන්නේ රත්නපුර දිස්ත්‍රික්කයෙන් තවත් ඉඩම් පැපිළියානට පුදන ලදි. රජුගේ අණින් මහබිසොවුන් වහන්සේට පින් පිණිස කුඩවසේ ලියදරයරුන් නවයොදුන්බද දෙනවක අරමණපොළ විහාර කර්මාන්තය කරවා පැපිළියානේ සුනේත්‍රා මහා දේවි පිරිවෙන්පති මංගල තෙරසාමීන් එහි වැඩමවා ගෙන වුන් උන්වහන්සේට එම විහාරය පූජා කොට තිබේ. එම ලියදරයරුන් විසින් තම උත්සාහයෙන් කෙහෙල්පත් දෙළ අමුණු බඳවා වඩුරියන් දහක් වූ ඇළක් කප්පවා වේල්ල බඳවා අස්වැද්දූ කෙහෙල්පත් දෙළ වෙලින් තුන් කරමින් කුඹුරු බිජුවට අමුණු පහළොවක්ද එහි වූ ගෙවත්තද, පරතරකය වෙලින් අමුතුවෙන් අස්වැද්දූ කොට කුඹුර බිජුවට අමුණු දෙකක්ද, සගල කන්දේ වල්පිට හා කැන්දන් ගමුවද, වාරියගම හා මගම ඇල්ලේවිල කුඹුරෙන් බිජුවට අමුණු දෙකක්ද, කණංකගේ කුඹුරින් අමුණු දෙකක්ද, දෙල්තොට කුඹුරෙන් අමුණු දෙකක්ද, ඒ ගමට ඇතුළත් වූ වල් විල් ආදියද ඉහතකී අරමණ පොළ විහාරයට පූජා කොට ඒ සියළු විහාරලාභය සුනේත්‍රා මහාදේවි පිරිවෙන්පති මංගල තෙර සාමීන්ට පූජා කර තිබේ.[4]

ලියදරයරුන් මේ සන්නස නිකුත් කළ දිනම, එනම් රජුගේ සූසාළිස් වැන්නේ ක්‍රි.ව. 1459 උඳුවප් පුර විසේනිය දිනම අරමණපොළ විහාර සන්තක ඉහතකී විහාර ලාභය පැපිළියාන පිරිවෙන්පති මංගල තෙර සාමීන්ට පූජා කළ බවට පැපිළියාන ශිලා ලේඛනයට පරිශිෂ්ටයක් සේ කොටවා තිබේ[5] ඉක්බිතිව ක්‍රි.ව. 1460 පොසොන් මස පුර පසළොස්වක්ද, ජයවර්ධනපුර චිත්‍ර මණ්ඩපයේ ඇමති ගණා පිරිවරා සිංහාසනාරූඪව ඉඳ රජතුමා විසින්ම පණවන ලද ආඥාවකින් මේ දීමනාව තහවුරු කොට තිබේ. ඒ පිළිබඳව තිරුවරහන් උලකුඩය විසින් සන්නස් පතක් නිකුත් කර ඇත.[6]

1. බටහිරින් මුද තෙර හා මෙම දිගින් දිය බස්නා කඩ වළ, පළමු ඉම් පත්‍රය, විද්‍යොදය 1, 297. පහළොස් වැනි සියවසේ නැදිමාල වර්තමාන දෙහිවල මුද වෙරළ තෙක් ව්‍යාප්ත විශාල ගමක් බව මින් පෙනේ.
2. දෙවැනි ඉම් පත්‍රය, විද්‍යෝදය I, 414, 415.
3. පැපිළියාන ලිපිය; කස., 40.
4. ලියදරයන්ගේ අරමණ පොළ සන්නස, විද්‍යෝදය, II, 9.
5. පැපිළියාන ශිලාලේඛනය, කස., 43.
6. අරමණ පොළ සන්නස් පත් කඩ, විද්‍යෝදය, II, 12.

ඉහත කළ සමීක්ෂණයෙන් පැපිළියාන විහාරය සෑදවූ වකවානුවේ එනම් ක්‍රි.ව. 1417 පමණ සිට වරින් වර රජු විසින් පැපිළියාන හා ඒ අවට්නුත්, සත් කෝරළය, සියනෑ කෝරළය, නව යොදුන් කෝරළය, පස් යොදුන් කෝරළය, මොරවක් කෝරළය, දකුණු පළාතේ වැලිගම් ප්‍රදේශය යන තැන්වලිනුත් පැපිළියානට පූජා කරන ලද ගොඩ මඩ ඉඩම් ප්‍රමාණය සලකා බලන ලදි. පහත දක්වෙන සටහනින් මෙය වඩාත් පැහැදිලි කර ගත හැකිය.

## පැපිළියාන විහාරය සන්තක දේපල

| | ගොඩ | | | මඩ | | | |
|---|---|---|---|---|---|---|---|
| | අමුණු, | පැල්, | ලාස්, | යාල්, | අමුණු, | පැල්, | ලාස් |
| 1. !. පැපිළියාන බද මැදිමාල ගමෙන් රජුගේ දහහත් වැන්නේ එනම් ක්‍රි.ව. 1432, දී ඇති ඉඩම් වට්ටෝරුවට අනුව[1] මැදිමාලට අයත් කුඹුරු, ඕවිටි, වල්, විල්වල ප්‍රමාණය උත්තේ තරමින් (වඩා සරු බිමින්) කුඹුරු, ... ... ... | — | — | — | — | 15, | 1, | 2 |
| මැද්දේ තරමින් (මධ්‍යම ප්‍රමාණයේ සරු) ... ... ... | — | — | — | — | 2, | 2, | 2 |
| පැස්සේ තරමින් (නිසරු බිමින් | — | — | — | — | 7[2] | — | — |
| ඕවිටි වලින්, ... ... | 5 | 2 | 5 | — | — | — | — |
| දෙණි අත් මං ඇතුළු තැනින්) ... | 5, | 1, | — | — | — | — | — |
| ii. රජුගේ තිස් නව වැන්නේ හෙවත් ක්‍රි.ව. 1454 ලිපියට අනුව[3] ඉහත සඳහන් මැදිමාල ඉඩම් වලට අතිරේකව දිවුල්පිටියේ උඩදෙණියෙන් | — | — | — | — | 10, | — | — |
| 2. පස්දුන් කෝරළේ බද කුඩවැලිගමින්, මෙය වේයන්ගල්ල, බොල්ලතාවිල, කෙසෙල්සේනාව, අරුග්ගොඩවිල යන ගම් සතරින් යුක්තය. රජුගේ තිස් නව වැන්නේ, එනම් ක්‍රි.ව. 1454 ලිපියට අනුව[4] මේවායේ දී ඇති ඉඩම් ප්‍රමාණ මෙසේය: | | | | | | | |
| i. කළුතොට බද්දෙන් අරුග්ගොඩ විලින් ... ... ... | — | — | — | ප්‍රමාණය දී නැත. | | | |
| ii. එහි බද විල්පිට, වකු වැළැත්[5] ඇතුළු තැන් ... ... ... | ප්‍රමාණය දී නැත | | | — | — | — | — |
| iii. මත්ගොන් බද්ද කෙසෙල් සේනාවෙන් ... ... ... | — | — | — | 1, | — | — | — |
| iv. එහි බද වල්පිට ... ... | ප්‍රමාණය දී නැත. | | | — | — | — | — |
| v. ගෙයිරන්ගොඩ[6] ... ... | ප්‍රමාණය දී නැත. | | | — | — | — | — |
| vi. අළුත්කුරුව බද බොල්ලතාවිලින් | — | — | — | 1, | — | — | — |
| vii. මෙහි බද ගොඩ, විලට නැගෙනහිරින්[7] | 10, | — | — | — | — | — | — |
| viii. මත්ගොන් බද්දෙන් බොඹුවලින් | — | — | — | 2, | — | — | — |
| ix. එහි බද ගොඩ ... ... ... | 10, | — | — | — | — | — | — |

1. **විද්‍යෝදය 1, 374–375 පිටු.**
2. මැදිමාල ඉඩම් ලැයිස්තුවේ අග පැස්සේ තරමින් ඉඩම්වල මුළු එකතුව කියන තැන සතරමුණක් යනු වෙන් එයි. (විද්‍යෝදය 1.375) එහෙත් ලැයිස්තුවේ දක්වා ඇති පැස්සේ තරමින් ඒ ඒ තැන ඉඩම් ප්‍රමාණවල, එකතුව සතර අමුණකට වැඩිය. එහෙයින් 'සතරමුණ' යන්න 'සතමුණ' වියයුතුය.
3. **කස., 41.**
4. කස., 40.
5. ''වකු වැළැත්'' යනු වකුවලට යාබද සමීප ඉඩම් විය හැකිය. ''වැළැත්'' අර්ථය සඳහා **ශ්‍රීසුසකෝ.**,893
6. **කස.**, 40.
7. මුල් ලිපියයේ ඇති වේයංගල්ල වෙනුවට මෙය යෙදී ඇත. දෙවැනි ඉම් පත්‍රය., **විද්‍යෝදය,** 1, 414; කස.,40.

| | ගොඩ | | | මඩ | | | |
|---|---|---|---|---|---|---|---|
| | අමුණු | පැල් | ලාස් | යාල් | අමුණු | පැල් | ලාස් |
| පසුපිටේ සියල්ල.... | 30 | 3 | 5 | 4 | 34, | 3, | 4 |
| 3. සියනෑ රට බද ගිරිදෙර[1] ... | ප්‍රමාණය දී නැත. | | | ප්‍රමාණය දී නැත. | | | |
| 4. බෙලිගල් නුවර බද මංගෙදර, ... | ප්‍රමාණය දී නැත. | | | ප්‍රමාණය දී නැත. | | | |
| 5. දෙළොස් දහස් රට බද මැදගොඩ මැඩලෙන් ... ... ... | 5, | — | — | — | 7[2] | — | — |
| 6. රයිගම නුවර බද ලෙනවර ගල්ලෙණ විහාරයට පිදූ සල්තොටින් ගෙවතුළකක්, | ප්‍රමාණය දී නැත. | | | — | — | — | — |
| සල්තොටින් කුඹුරු ... ... | — | — | — | — | — | 3 | — |
| 7. වැලිගම දසගමුව බද කනංකගේ විහාරයට පිදූ ඉත්තවල, පාබතලාවල, දම්ලියද්ද, තැඹිලිහිර ඇතුළුවූ කුඹුරු බිජුවට, ... ... ... | — | — | — | — | 5, | — | — |
| එපාමුල ඕවිට ... ... | 1, | 1, | — | — | — | — | — |
| 8. උවාලුගොඩ, උදි ගොඩ, නතුගොඩ, වැල්ලානෝ ඇතුළු තැන් ... ... | ප්‍රමාණය දී නැත. | | | — | — | — | — |
| 9. බෙලිගල් නුවර බද බුලත් ගම් සැලැස්මෙන් පිට්ටාගම ... ... | ප්‍රමාණය දී නැත. | | | — | — | — | — |
| 10. රජුගේ සිවු සාළිස් වැන්නේ එනම්, ක්‍රි.ව. 1459 කෙහෙල්පත් දෙළ වෙලින්, තුන් තරමින්[3] (කුඹුරු) ... ... | — | — | — | — | 15 | — | — |
| එහි බද ඒ ඒ තැන් ගෙවතු... ... | ප්‍රමාණය දී නැත. | | | | | | |
| 11. පරතරකය කෙලින් අමුතුව අස්වැද්ද කොට කුඹුර ... ... ... | — | — | — | 0 | 2 | 0 | 0 |
| 12. මිරිස්ගල කන්දේ වල්පිට ... ... | ප්‍රමාණය දී නැත | | | — | — | — | — |
| 13. කැනදන් ගමුව හා වාරියගම හා මේම ගමින් ඇල්ලේ කුඹුරෙන් ... | — | — | — | 0 | 2 | 0 | 0 |
| 14. කනංකේ කුඹුරෙන්... ... | — | — | — | 0 | 2 | 0 | 0 |
| 15. දෙල්තොට කුඹුර[4] ... ... | — | — | — | 0 | 2 | 0 | 0 |
| 16. දෙණි පිටින්[5] ... ... ... | — | — | — | 0 | 1 | 1 | 0 |
| 17. කන්දෙ දෙණිය පුරණ ... ... | — | — | — | 0 | 0 | 2 | 0 |
| | 37 | 0 | 5 | 4 | 72 | 9 | 4 |
| | | | | 7 | 12 | 1 | 4 |

යාළ අමුණු විස්සේ ගණනට අනුව බැලුව හොත් ක්‍රි.ව. 1459 වර්ෂය වන විට පැපිළියාන විහාරයට අයත් ගොඩ ඉඩම් ප්‍රමාණය **අමුණු තිස් හතයි ලාස් පහක් වූ අතර මඩ ඉඩම් ප්‍රමාණය අමුණු එකසිය පණස් දෙකයි පැල් එකයි ලාස් හතරකි.**

1. කස., 40.
2. බී. ගුණසේකර මෙය "සතරමුණත්" යනුවෙන් කියවා ඇත. JCBRAS., Vol., VII, No. 25, 1882, P. 189. එහෙත් **කොඩ්රිංටන්** හා **ඩී. බී. ජයතිලක** යන දෙදෙනාම ගෙන ඇත්තේ "සතමුණ" යනුවෙනි.
3. **කස.**, 43.
4. **කස.**, 43.
5. **විද්‍යෝදය**, 1, 416.

අමුණක වපසරිය අක්කර දෙකත් දෙක හමාරත් අතරේ ප්‍රමාණයකැයි සාමාන්‍යයෙන් සැලකේ. අක්කර දෙක සේ ගතහොත් පැපිළියාන විහාරය සතුව තිබූ, වපසරි ප්‍රමාණය දී ඇති ගොඩ ඉඩම්වල විශාලත්වය අක්කර 74 යි පර්චස් 10 ක් පමණ වෙයි. මඩ ඉඩම්වල ප්‍රමාණය අක්කර 304 රූඩ් 1 යි පර්චස් 16 කි. මේ අනුව ක්‍රි.ව. 1459 වන විට ප්‍රමාණය දී ඇතිගොඩ මඩ ඉඩම්වල මුළු ප්‍රමාණය අක්කර 378යි. රූඩ් 1යි. පර්චස් 26කි.

| අක්කර | රූඩ් | පර්චස් |
|---|---|---|
| 304 | 1 | 16 |
| 74 | 0 | 10 |
| 378 | 1 | 26 |

## වහල්:

රජුගේ තිස් නව වැන්න හෙවත් ක්‍රි.ව. 1454 වන විට පරිවාර ජනයා දෙසිය පණහක්ද[1] රජුගේ හතළිස් වැන්න හෙවත් ක්‍රි.ව. 1455 දී තවත් ගැහැණු පිරිමි විස්සක් ද[2] දී ඇත. මේ අනුව ක්‍රි.ව. 1459 වැන්න වන විට මුළු පරිවාර ජන සංඛ්‍යාව 270 ක් වෙයි.

## සරක්:

ක්‍රි.ව. 1454 වනවිට සරක් දෙයාලකි.[3] ඇතිනි රූ දෙකකි. ලුණු පාරු එකකි.[4]

## IV. විහාර ලාභය පරිහරණය:

ඉහත දුටු ඉඩ කඩම් දැසි දස් සරක් ගරුභාණ්ඩ පරිහරණය කළ ආකාරය පිළිබඳ තොරතුරු පැපිළියාන ශිලා ලේඛනයේ එයි. සන්සන්දනාත්මකව බලන කල දහ වැනි සියවසේ මිහින්තලා පුවරු ලිපියෙන් අභය ගිරියේ හා සෑගිරියේ දේපළ පරිහරණය පිළිබඳව දෙන තොරතුරු තරම් සවිස්තර තොරතුරු මෙහි නොලැබේ. අභයගිරියේ හා සෑගිරියේ දේපළ පරිහරණ සැලැස්ම තරම් සංකීර්ණ සැලැස්මක්ද මෙහි නැත. එසේ වුවද ඉහතද සලකා බැලූ අයුරු දහවැනි සියවසෙන් පසුව විහාර දේපළ පරිහරණය පිළිබඳව තොරතුරු ලැබෙන එකම අවස්ථාව මෙය නිසා ඒ ලැබෙන තොරතුරු මෙම අධ්‍යයනයට උපයෝගී කරගනු ලැබේ.

සුනේත්‍රා මහා දේවී පිරිවෙනේ ආදායමෙන් අනිවාර්යයෙන් ඉටු කළ යුතු වැය ශීර්ෂ පහත දැක්වේ

1. තුන් බෝධියට හා නාථ මෛත්‍රී දෙතැනට මුළුතැනට,
2. පිරිවෙන් පතින් වහන්සේ
   විධානේ තැන ඇතුළු විහාරයේ වැඩ සිටින පස්නමට,
3. ත්‍රිපිටකයෙන් මසකට ග්‍රන්ථ එක දහස් සත්සියයක් බැගින් ලියන ලියන්නන් හට,

1. කස., 41.
2. විද්‍යෝදය, 1, 416, කස., 43.
3. කස., 41, යාළකට සරක් විස්සක් සේ සැලකේ.
4. කස., 41.

4. තුන් මසින් තුන් මස සතර දිගින් විහාරයට වඩනා මහා සංඝයා වහන්සේට

5. වසරකට වරක් මවු බිසවුන් වහන්සේට පින් පිණිස කෙරෙන පූජාවට අවශ්‍ය

6. විශේෂ අවුරුදු පූජාවට.

මේ වැය ශීර්ෂ හයට දිනපතා මාස්පතා සහ අවුරුදු පතා දිය යුතු දීමනා වෙන් වෙන්ව දක්වා ඇත.

## 1. තුන් බෝධිය හා නාථ මෛත්‍රී දෙතැනට මුළුතැනට

මෙම වැය ශීර්ෂය සඳහා බොහෝ කොටම වූයේ දිනපතා ගෙවීමය. තුන් බෝධිය යන්නෙන් එක්වරම හැඟී යන්නේ බෝධි වෘක්ෂ තුනක් යන අරුතයි. එහෙත් මෙතැන තුන් බෝධිය යනුවෙන් ගැනුණේ දගැබ, බෝධිය හා පිළිම ගෙය යන තුන් තැනයයි සිතිය යුතුය.[1] **රාජරත්නාකරයේද**, 'පැපිළියාන නම් තුන් බෝ පිහිටි මහා විහාරයක් කරවා'යි සඳහන් වේ.[2] පැපිළියාන ශිලා ලේඛනය පිහිටවූ දිනම නිකුත් කර ඇති **මහ සමන් දේවාල සන්නසේද** සමන් දේවාලය හා සම්බන්ධ විහාරයේ තුන් බෝධියක් වූ බව සඳහන් වේ.[3] **සැළලිහිණි සංදේශයේ** සැළලිහිණියාට කිත්සිරි මෙවන් කැළණියේදී දගැප් මහබෝ පිළිම යන ප්‍රධාන ස්ථාන තුන වඳින ලෙස කියන ලදි.[4] මේ පූජා ස්ථාන තුන සාමාන්‍යයෙන් හඳුන්වන ලද්දේ චෛත්‍ය යනුවෙනි. ශාරීරික පාරිභෝගික හා උද්දේසික යනුවෙනි. 15 වැනි සියවස තරමේ මේවා බෝධි නමින් හැඳින්වුණේ ඇයිද යනු පැහැදිළි නැත.

නාථ මෛත්‍රී දෙතැන යනු අවලෝකිතේශ්වර නාථ හා මෛත්‍රී යන බෝසත්වරුන් දෙදෙනා සඳහා ඉදි කළ පිළිම බවට සැක නැත. 14 වැනි 15 වැනි සියවස් වල නාථ මෛත්‍රී ලංකාවේ විහාරවල පිදුම් ලද බවට සාක්ෂි තිබේ. 14 සියවසේ ගම්පල අළුදෙනිය විහාරයේ බිතු සිතුවම් අතර නාථ මෛත්‍රී රූප දක්වේ.[5] ගඩලාදෙණි විහාරයේද වජ්‍රාසනාරූඪ බුදුන් පිරිවරා සිටි දෙව් පිරිස අතර නාථ මෛත්‍රී රූප දක්වේ.[6] කෑගලු දිස්ත්‍රික්කයේ බෙලිගල් කෝරළයේ දෙරවක විහාරයේ බුදු මැදුරෙහි නාථ පිළිමයක් පැවතියේය.[7] 15 වැනි සියවසේ තොටගමුවේ විජයබා පිරිවෙන් විහාරයේද මතු බුදුවන නාථ බෝසතුන්ගේ පිළිමයක් වූ බව **ගිරා සංදේශයේ** දක්වේ.[8]

දගැබ්, බෝධිය, පිළිම ගෙය, නාථ පිළිමය, මෛත්‍රී පිළිමය, යන පස් පොළට දින පතා මුළුතැන් පිදිය යුතු විය. මුළු තැන් යනුවෙන් මෙහි අදහස් කෙරෙන්නේ

---

1. **ශ්‍රී සුමංගල ශබ්ද කෝෂය; ශ්‍රී සුශකෝ**, 377 පිට.
2. ''පැපිළියාන නම් තුන්බෝ පිහිටි මහා විහාරයක් කරවා'', **රාජ රත්නාකරය, රාර**, 46 පිට
3. **The Ceylon Antiquary**, CA., Vol. II, pt. 1, p. 44.
4. **සැළලිහිණි සන්දේශය**, 42. කව.
5. **ගම්පළ ඉතිහාසය, පී. වරසම්බෝධි ථෙර**, 1948. 183 පිට.
6. ''පල්ලෙ මාලෙ ශක්‍ර බ්‍රහ්ම සුයාම සන්තුෂිත නාථ, මයිත්‍රී ආදි දෙවියන් විසින් පිරිවරන ලද'' EZ., IV. 101.
7. **තිසර සන්දේශය**, 130 කව.
8. **ගිරා සංදේශය**, 230 කව.

දනයයි. මේ පස්පොළටම මුළුතැන් සඳහා සහල් යනාදිය වෙන වෙනම නොව එකට දී තිබීමෙන් පැහැදිළි වන්නේ තුන් බෝධියට හා නාථ මෛත්‍රී දෙපොළට මුළුතැන එකට පිළියෙල කළ බවකි. එය විහාරයේ ආදයමෙන් දිනපතා වෙන් කෙරෙන එක් වැය ශීර්ෂයක් සේ සලකා ඇත. මේ වැය ශීර්ෂය සඳහා දිනකට සහල් නැළි පහළොහක් ද මාළු සඳහා මසුරන් තුනක්, පොල්ගෙඩි තුනක්, සකුරු මුළු එකක්, ලුණු නැළි මුක්කාලක්, ලූනු, දුරු කහ ආදි දෙයට මසුරන් එකක්, පාන්තෙලට පොල් පහළොසක්, සුවඳ මල් දහසක්, බුලත් විසිහයක්, පුවක් පසළොසක් යන මේවා දිනපතා දිය යුතුව තිබිණ. මිරිස්, දුම්තෙල්, සඳුන්, අගිල්, ගුගුල් යන මේවා මාස්පතා දෙන ලදි. මහා සමන් දේවාල යේද තුන්බෝධියට හා සමන් දෙවියන් බිසෝ දෙවියන් කුමාර දෙවියන් යන තුන් තැනට දෛනික මුළු තැනක් නියම කොට ඇත. එහිද එකී පූජාවට නියම කොට ඇත්තේ මේ දේවල්මය. එහි හකුරු ඇරෙන විට අනෙක් සියලුම ද්‍රව්‍ය නියම කොට ඇත්තේ පැපිළියානේ නියම කළ ප්‍රමාණම බව පෙනේ. සකුරු පමණක් පැපිළියානට එක මුළක්ද සමන් දේවාලයට මුළු තුනක්ද නියම කොට ඇත.[1]

**2. පිරිවෙන් පතින් ඇතුළු ගෙණෙහි වැඩහිඳිනා භික්ෂූන්ට,**

පිරිවෙන් පතින් වහන්සේටද ගෙණෙහි වැඩ හිඳුනා හෙවත් විහාරයේ නිත්‍ය වාසි භික්ෂූන් වහන්සේ පස්නමටද දිනපතා සහල් පොල් ආදිය නියම කොට තිබේ. මෙය දෙවැනි අනිවාර්ය වැය ශීර්ෂයයි. විහාරයේ නිත්‍ය වාසී පස් නම අතර විධානේ තැන නමින් විශේෂයෙන් හැඳින්වුණු භික්ෂුවක් සිටි බව පෙනේ. පිරිවෙන් පතින් වහන්සේට දිනකට දිය යුතු සහල් ප්‍රමාණය නැළි හයකැයි වෙනම දක්වා ඇති අතර, විධානේ තැන ඇතුළු අනෙක් පස් නමට පොදුවේ නමකට සතර ගණනේ සහල් නැළි විස්සකැයි මුළු ගණන දක්වා ඇත. එසේ වුවද දවසකට දිය යුතු බුලත් පුවක් ප්‍රමාණ දැක්වීමේදී පිරිවෙන් පතින් වහන්සේට වෙනමත්, විධානේ තැනට වෙනමත්, අනෙක් නම් සතරට පොදුවේ මුළු ගණනකුත් දී ඇත. විහාරයේ නිත්‍යවාසි භික්ෂූන් සය නමට දීමනා තීරණය කිරීමේදී පිරිවෙන් පතින් වහන්සේට ප්‍රථම ස්ථානයද විධානේ තැනට ද්විතීය ස්ථානයද හිමිවූ අතර අනෙක් සතර නම සමාන තත්වයෙන් තුන්වැනි ස්ථානයේ ලා සලකා ඇති බව පෙනී යයි.[2]

දිනකට මුළුතැනට අවශ්‍ය පොල් හා පහන්තෙලට අවශ්‍ය පොල්ද මාලු වලට[3] අවශ්‍ය රන්ද, කසපැන් හා සකුරුද නියම කිරීමේදී පිරිවෙන් පතින් වහන්සේට හා විධානේ තැනට විශේෂ ප්‍රමාණ දක්වා නැත. මින් වැටහෙන්නේ පොල්, මාළු, කසපැන්, හා සකුරු යන මේවා පිරිවෙන් පතින්වහන්සේද ඇතුළු විහාරවාසී භික්ෂූන් සය නමට පොදුවේ භුක්ති විඳිනු සඳහා දිනකට ප්‍රමාණයන් නියම කොට ඇති බවය.

විහාරවාසී භික්ෂූන්ගේ මුළුතැනට අවශ්‍ය ලුණු, මිරිස්, හා දුන්තෙල්ද ඉසේ ගාන තෙල්ද ලූනු දුරු කහ යනාදිය සඳහා මුදල්ද මසකට වරක් බැගින්දී ඇත.

---

1. **මහ සමන් දේවාල සන්නස,** CALR, II, I, p. 43
2. ඒ ඒ අයට දුන් ප්‍රමාණ පිළිබඳව. සටහන බලන්න.
3. මෙතැන මාලු යනුවෙන් අදහස් කැරුණේ ව්‍යඤ්ජන යන්නය; **ශ්‍රී සුශකෝ.**, 723.

මාලු, පොල්, කසපැන්, සකුරු, පාන් තෙල්, ලූණු, මිරිස්, ලූනු, දුරු, කහ, දුම්තෙල් ඉස්තෙල් ආදිය පිරිවෙන්පතීන් ඇතුළුව විහාරවාසී භික්ෂූන් සයනමට පරිභෝජනය සඳහා පොදුවේ සපයන ලදැයි ඉහත සලකා බලන ලදී. මෙවායින් බොහොමයක් උදේ හා දවල් දනයට අවශ්‍ය දේවල්ය. මින් හැඟී යන්නේ විහාරවාසී භික්ෂූන්ට දනය පොදුවේ එකට පිළියෙල කළ බවකි. දිනකට අවශ්‍ය සහල් ප්‍රමාණය දැක්වීමේදී පිරිවෙන් පතීන්ට පමණක් විශේෂ ප්‍රමාණයක් නියම කොට දැක්වූයේ ඇයිද යන ප්‍රශ්නය පැන නගී. පිරිවෙන් පතීන්ට වෙනම බතකුත් අනෙක් පස් නමට වෙනම බතකුත් පිසින ලදැයි සිතිය හැකිද? එහෙත් ඉහත දුටු අයුරු ව්‍යඤ්ජන පොදුවේ සම්පාදනය වී නම් බත පමණක් වෙනම පිළියෙළ කිරිමේ තේරුමක් නැත. මේනිසා පිරිවෙන් පතීන්ට වෙනම විශේෂ ප්‍රමාණයක් දැක්වුවද, උන්වහන්සේට නියමිත සහල් ප්‍රමණයද ගෙන විහාරවාසී සය නමට එකම බත් සැළියක් පිළියෙළ වූහයි සිතන්නට සිදුවේ.

දිනපතා බුලත් පුවක් වෙන් කිරීමේදී පිරිවෙන් පතීන්ට වෙනමත් විධානේ තැනට වෙනමත් අනෙක් සතර නමට එකටත් වෙන් කොට ඇති ආකාරය සිතා බලන විට පිරිවෙන් පතීන්ගේ කුටියේ එක් බුලත් තටුවකුත් විධානේ තැනගේ කුටියේ එක් බුලත් තටුවකුත් පොදුවේ අනික් හතර නම සඳහා තවත් බුලත් තටුවකුත් වශයෙන් වෙන් වෙන් බුලත් තටු තුනක් පවතින්නට ඇතැයි නිගමනය කළ හැකිය.

පිරිවෙන් පතීන්, විධානේ තැන ඇතුළු විහාරස්ථ භික්ෂූන් හය නමටම වසරකට වරක් ඇඳුම් සඳහා ගෙවා තිබේ. වාර්ෂික දීමනා දැක්වෙන සටහනින් ඒ ඒ හිමිවරුන්ගේ තරාතිරමට අනුව ඇඳුම්වලට ගෙවීම් කර ඇති ආකාරය වටහාගත හැකිය.

### 3. ත්‍රිපිටක ග්‍රන්ථ ලියන්නන්ට,

ධර්ම ග්‍රන්ථ සුලභ කිරීම රජුගේ වගකීමක් සේ අනුරාධපුර පොළොන්නරු යුගවල සිටම පිළිගැනී තිබිණ. දඹදෙණියේ තුන්වැනි විජයබා රජු ශීඝ්‍ර ලේඛනයෙහි දක්ෂ ලේඛකයනට රජ ගෙදරින් වැටුප් දී පොත් පත් ලියවූ බව කියැවේ. VI පරාක්‍රමබාහු රජු පැපිළියානේ පිටකත්‍රය ටීකාර්ථ කථා සහිත කොට දවස් පතා පොත් ලියන සේ ගම්බිම් කෙත්වතු පිදූ බව කියවේ.[1]

ලේඛකයකු විසින් මසකට ග්‍රන්ථ එක්දහස් සත්සියයක් ලිවිය යුතුය. මෙහි ග්‍රන්ථ යනු අකුරු තිස් දෙකකි.[2] එවිට මසක් තුළ එක් ලියන්නකු අකුරු 54400ක් ලිවිය යුතුය. එසේ ලියන්නකුට දිනකට සහල් නැළි තුනක්ද මාළු සඳහා මසුරන් දෙකක්ද පොල් දෙකක් බුලත් දසයක් හා පුවක් පහක් ද ලැබේ.

ලූණු ද මිරිස් ද ලූනු, දුරු, කහ ආදියට මුදල් ද ලැබෙන්නේ මාස් පතාය. රෙදි සඳහා මුදල් ලැබෙන්නේ අවුරුද්දකට වරකි. මොවුන්ට කසපැන්, පහන් තෙල් ඉස් තෙල්, දුන්තෙල්, ආදිය නිර්දේශ කොට නැත. පහන් තෙල්, දුන්තෙල්, ඉස්තෙල්, අවශ්‍ය වන්නේ කෑම පිසගෙන කමින් නේවාසිකව සිටින විටය. පොත් ලියන්නන්ගේ වැය ශීර්ෂයට ඒවා ඇතුළත් කොට නැත්තේ ඔවුන් පිරිවෙනේ නේවාසිකව නැවතී නොසිටි නිසාය යයි සිතිය හැකිය.

---

1. 'එහිම පිටකත්‍රය අර්ථ කථා සහිත කොට ලියවා දවස්පතා නොහැර ලියනසේ ගම්බිම් කෙත්වත් පුද;' රාර, 46 ''ධර්මාගම පොත් පත් ලියවා'' සරක; 320.
2. ශ්‍රීසුශකෝ; 825.

''ත්‍රිපිටකයෙන් මසකට ග්‍රන්ථ එක් දහස් සත් සියයක් ලියන්නන් එකකුට'' යන තැන ''එකකුට'' යන වචනය යෙදී ඇති ආකාරය සිහිපත් කරන විට මේ ලියන්නන් ගිහීන් බව හැඟී යයි. භික්ෂූන් සඳහන් කරන තැන එකකුට යනුවෙන් නොයෙදෙන නිසාය. මොවුන් විසින් කරන ලද්දේ ග්‍රන්ථ කරණයක් නොව ත්‍රිපිටක ග්‍රන්ථ පිටපත් කිරීමකි. අකුරු පැහැදිලිවටත් ඉක්මනවත් ලිවිය හැකි පුද්ගලයන් මේ සඳහා තෝරා ගන්නට ඇත. ඉහත දුටු අයුරු ඇත ප්‍රදේශවල පුද්ගලයන් මෙන්ම පැපිළියාන හා ඒ අවට සිටි දක්ෂ ලියන්නන් මේ සඳහා යොදවන්නට ඇත.[1] ඔවුන් තම තමන්ගේ නිවෙස්වල සිට උදේ පිරිවෙනට පැමිණ දවල් දවස තුළ ලියා සවස දවසට නියමිත දීමනාද රැගෙන පෙරළා සිය නිවෙස්වලට ගිය දෛනික ලේඛකයනැයි සිතීම සාධාරණය. ග්‍රන්ථ 1700 ක් ලියා අවසන්වූ පසු මාසයකට ලැබෙන ලුණු නැළි 10 ද, ලූනු දුරු කහ ආදිය සඳහා ලැබෙන පණමද, මිරිස් නැළියද ලබාගත්හයි සිතිය හැකිය. මේ ආකාරයෙන් දිනකට ලියන්නන් කී දෙනකු ලිවීමේ නියැළී සිටියාහුදැයි දැන ගන්නට සාක්ෂි නැත.

මොවුන්ට ඇඳුම් සඳහා වසරකට වරක් ගෙවා තිබේ. එක් අයකුට වසරකට රෙදි සඳහා ලැබෙන්නේ පණම් 100කි.[2]

**4. තුන්මසින් තුන්මස සතරදිගින් වඩනා සංඝයාට,**

පිරිවෙනේ වැය ශීර්ෂ අතර හතරවැනි වැය ශීර්ෂය වශයෙන් සැලකිය හැක්කේ සතර දිගින් වඩනා ආගන්තුක සංඝයාට දෛනික දීමනාය. විහාර සන්තක දේපල සතර දිගින් වඩනා සංඝයාට පොදුවේ අයත්ය, යන්න සාමාන්‍ය පිළිගැනීම විය. පැපිළියානට පිදූ දෙපළ වුවද ''බුද්ධායත්තව, ධර්මායත්තව මහා සාංඝිකව පවත්නා ලෙස'' සලස්වා ඉක්බිති පිරිවෙන් පතීන් වහන්සේට පුද ඇත.[3] අරමණ පොළ විහාරයට පිදූ ඉඩ කඩම්ද පළමුව තුනුරුවන් සන්තක කොට ඉක්බිති සුනේත්‍රා මහා දේවි පිරුවන් නායක මංගල තෙර සාමින්ට පුද ඇත.[4] මේ අනුව සතර දිගින් වඩනා ආගන්තුක සංඝයාට ආහාර පාන පහසුකම් ලබමින් පිරිවෙනේ නැවතී සිටීමට අයිතියක් තිබූ බව පිළිගැනී තිබිණ. එසේ පැමිණෙන භික්ෂුවකට දින තුනක් යැපීම් හා නවාතැන් දිය යුතුය. විහාර සන්තක නොයෙක් ගම්වලින් විධානයට පසමුණක් වෙන්කොට ඉතිරි ලාභයෙන් සතරදිගින් වඩනා සංඝයාට දන්වැට සලසන ලෙස රජතුමා පැපිළියාන ශිලා ලේඛනයේ ව්‍යවස්ථා පණවා තිබේ.

දිවයිනේ විවිධ දිසාවන්ගෙන් මෙසේ පැමිණි භික්ෂූන් අතර තුන් මාසයෙන් තුන් මාසයට පැමිණි භික්ෂූහු වූහ. ඒ භික්ෂූන් තුන්මසකට වරක් පැපිළියානට පැමිණීමට බැඳී සිටි බවක් මින් හැඟේ. එසේ බැඳී සිටියේ ඇයිද, ඔවුන් කුමන ප්‍රදේශවල සිට පැමිණි අයද, යනාදී තොරතුරු දැන ගැනීමට එකඑල්ලේ රුකුළක් නැත. එසේ වුවද පැපිළියාන විහාරයට අනුබද්ධ විහාර දිවයිනේ ඒ ඒ ප්‍රදේශවල පැවැති බව පෙනේ. ඒවායේ ඉඩකඩම් ඇතුළු විහාර ලාභයද පැපිළියානට නතු කොට තිබිණ. නිදසුන්

1. දඹදෙණි සමයේ තුන්වැනි විජයබාහු රජ ශීඝ්‍ර ලේඛනයෙහි දක්ෂ, බහුශ්‍රැත ලේඛකයන් යෙදූ බව කියැවේ. මව. 79, 42–44.
2. කස., 41.
3. පැපිළියානේ ශිලා ලේඛනය, කස., 41.
4. කස., 43.

වශයෙන් රත්නපුර දිස්ත්‍රික්කයේ දෙනවක අරමණපළ විහාරය හා විහාර ලාභය පැපිළියාන සන්තක කොට තිබිණ. තවද රයිගම නුවර බද ලෙණවර ගල්ලෙන් විහාරය, දකුණු පළාතේ වැලිගම දසගමුව බද කනංකේ විහාරය යන මේ විහාර සතු ඉඩකඩම් පැපිළියානට ලියාදී තිබිණ. මේ විහාර එතැන් සිට පැපිළියානට අනුබද්ධ විහාර සේ සැලකුණු බැව් නිසැකය. පැපිළියානට එන ගිලන් භික්ෂූන්ට ලෙඩ සුව වන තෙක් ගිලන් පස දී ඉක්බිති යවන ලෙසට නිර්දේශ කොට ඇති වත්තල, කැළණිය, අතුරුගිරිය විදගම, කළුතොට යන විහාරද පැපිළියාන විහාරයට අනුබද්ධ විහාරයේ සැලකුණ විය හැක. මේ විහාර වාසී භික්ෂූන් තම තමන්ගේ විහාරවල ඉපදෙන ආදායම්ද ගෙන්වාගෙන වරින් වර මූලස්ථාන විහාරය වන පැපිළියානට පැමිණ පිරිවෙන් පතීන් වහන්සේ බැහැදැකිය යුතුව තිබිණැයි අනුමාන කළ හැකිය. තුන් මසින් තුන් මසට විහාරයට පැමිණෙන සංඝයා යනුවෙන් සඳහන් කරන ලද්දේ අනුබද්ධ විහාරවල සිට එසේ පැමිණි භික්ෂූන්-යැයි සිතා ගත හැකිය.

මෙසේ සතර දිගින් පැපිළියානට එන සංඝයාට දින තුනක් නතරව සිටිය හැකි විය. දින තුනට නතරවී සිටීමට අවශ්‍ය කළාල, පැදුරු, ඇතිරිලි, පැන් වළන් ඇතුළු දන්වැට නොපිරිහෙළා පැවැත්විය යුතු බවට පැපිළියාන ශිලා ලේඛනයේ ව්‍යවස්ථා කොට තිබේ.

### 5. අවුරුදු පූජාව:

අවුරුදු පූජාව යනුවෙන් හැඳින්වූයේ කුමක්දැයි හරියට පැහැදිලි නැත. නිසැක වශයෙන්ම එය වර්ෂයකට වරක් පවත්වන විශේෂ උත්සවයක් බව නම් පැහැදිලිය. වර්තමාන ව්‍යවහාරයෙන් නම් එය සාංවත්සරිකෝත්සවය යනුවෙන් හැඳින්විය හැකිය

VI පරාක්‍රමබාහු රජුගේ නියමයෙන් පැපිළියානේ සුනේත්‍රා මහා දේවි විහාරයට අයත්ව පවත්නා නියාවෙන් කුඩවස ලියදරයරුන් විසින් නවයොදුන් රට කරවූ අරමණපල විහාරයේද අවුරුදු පූජාවක් හා වෙසක් පූජාවක් පැවැත්වූ බව අරමණපොළ ලියදරයන්ගේ සන්නසේ සඳහන් වෙයි.[1] මේ පූජාව එකී විහාරස්ථානය ආරම්භ කළ දිනය සිහිපත් කිරීම සඳහා වසරකට වරක් පැවැත්වුණක්ද, නො එසේ නම් අප්‍රේල් 13,14 දිනවල පැවැත්වෙන අළුත් අවුරුදු උත්සවය වකවානුවේ පැවැත්වුණු උත්සවයක්දැයි හරියට නිශ්චය කළ නොහැක. පැපිළියානේ පැවැත්වුණු අවුරුදු පූජාවට කැකුළු පැසි සාල් නැළි එක සිය පණහක්ද පොල් සියයක් ද පහන් පූජාවට පොල් දහසක්ද නියම කොට තිබේ. මේ දීමනා වර්ෂයකට වරක් කරන ලද ඒවාය.

### 6. විශේෂ පූජාව:

පැපිළියානේ වාර්ෂිකව පැවැත්වුණ අනෙක් විශේෂ පූජාව මවු බිසොවුන් වෙනුවෙන් පැවැත්වුණකි. මෙය මවු බිසවුන් ස්වර්ගස්ථ වූ වෙසක් මස පුර විසේනිය හෙවත් පස් වැනිද ආරම්භ වී පුර පසළොස්වක ද අවසන් වන ලෙස දින දහයක් තිස්සේ පැවැත්වුණු විශේෂ පූජාවකි. මේ සඳහා අවුරුදු පූජාවට මෙන් දෙගුණයක් දීමනා නියම කොට ඇත. කැකුළු පැසි සහල් නැළි තුන් සියයක්ද පොල් දෙසියයක්ද පහන් පූජාවට පොල් දෙදහසක්ද දිය යුතු විය.

1. විද්‍යොදය, ii, 11,12 පිටු.

# දෛනික හා මාසික වැය සීට්ටුව

| | දි න ප තා | | | | | | | | | මා ස් ප තා | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | සහල් | පොල් | | මාලු රන් | බුලත් | පුවක් | කසපැන් | සකුරු මුළු | සුවඳ මල් | මිරිස් නැළි | ලුනු,දුරු කහ ආදියට | ඉස් තෙල් දුම්තෙල් නැළි | ලුණු නැළි | සඳුන්, අගිල් ගුගුල් |
| | | මුළු තැනට | පාන් කෙලට | | | | | | | | | | | |
| 1. තුන් බෝධියට හා නාථ මෛත්‍රි දෙතැනට, | පැසි 15 | 03 | 15 | 03 | 26 | 15 | — | 01 | 10000 | මසකට 02 | දිනකට මඤ්ඤරන් 01 | මසකට 02 | දිනකට ¼ | මසකට පිරිබඩට |
| 2. පිරිවෙන් සාමීන්ට, විධානේ තැනට, සෙසු සතර නමට, | පැසි 06 (4 × 5) 20 | 09 | 06 | 08 | 30 15 (12 × 4) 48 | 15 7 (6 × 4 24 | 07 | 3½ | | මසකට 06 | මසකට පණම් 09 | 22½ | මසකට 50 | සඳුන් පළම් 8 සුවඳ දුමට |
| 3. ත්‍රිපිටකය ලියන අයකුට, | 03 | 02 | — | 02 | 10 | 05 | — | — | — | 01 | පණම් 01 | — | 10 | සඳුන් පළම් 3 අගිල් පළම් 3 |
| 4. සතර දිගින් වඩනා තෙර නොවන නමකට, | 04 | 01 | — | 01 | 10 | 05 | 01 | 0½ | — | ප්‍රමාණය දී නැත | ප්‍රමාණය දී නැත | ප්‍රමාණය දී නැත | ප්‍රමාණය දී නැත | ගුගුල් පළම් 3 |
| 5. සතර දිගින් වඩනා තෙර නමකට, | 05 | 04 | — | 03 | 30 | 15 | 02 | 01 | — | ප්‍රමාණය දී නැත | ප්‍රමාණය දී නැත | ප්‍රමාණය දී නැත | ප්‍රමාණය දී නැත | |

## වාර්ෂික වැය සිට්ටුව

| | සහල් නැළි මුළුතැනට | පොල් | | සිවුරු | අඳන | දන්කඩ | බතබඳනා | අටපිරිකර | ඇඳුම |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | මුළුතැනට | පාන් තෙලට | | | | | | |
| 1. පිරිවෙන් සාමීන්ට, | | | | එකක් පණම් 100 බැගින් රෙදි 02 | පණම් 25 වටිනා රෙදි 01 | පණම් 07 වටිනා 01 | එකක් පණම් 10 ගණනේ 02 | 01 | |
| 2. විධානේ තැන ඇතුළු පස් නමට, | | | | එකක් පණම් 30 බැගින් රෙදි 10 | එකක් පණම් 15 බැගින් රෙදි 05 | එකක් පණම් 03 වටිනා 05 | එකක් පණම් 02 වටිනා 10 | 05 | |
| 3. ත්‍රිපිටකය ලියන අයකුට, | | | | | | | | | රෙදි එක කට පණම් 100 |
| 4. මවු බිසව වෙනුවෙන් විශේෂ පූජාවකට, | කැකුළු පැසි 300 | 200 | 2000 | | | | | | |
| 5. අවුරුදු පූජාවට, | කැකුළු පැසි 150 | 100 | 1000 | | | | | | |

ඉහත සලකා බලන ලද වැය ශීර්ෂ සඳහා කළ ගෙවීම්, ද්‍රව්‍යවලින් කළ ගෙවීම් සහ මුදල්වලින් කළ ගෙවීම් යනුවෙන් බෙද විමසා බැලිය හැකිය. දිනපතා ද්‍රව්‍ය වලින් කළ ගෙවීම් නම් සහල්, පොල්, බුලත්, පුවක්, කසපැන්, සකුරු යන මේවාය. ලුණු, මිරිස්, දුම්තෙල්, ඉස්තෙල්, සඳුන්, අහිල්, ගුගුල් යන මේවා මසකට ද්‍රව්‍ය වලින් කළ ගෙවීම්ය. ඉහත සටහන් දෙකෙන් මෙය පැහැදිලි වනු ඇත.

**ද්‍රව්‍ය වලින් කළ ගෙවීම්,**

**සහල්:**

සහල් ගැන සඳහන් කිරීමේදී සාල්, පාසි සාල්, කැකුළු පැසි යන වචන තුන ව්‍යවහාර කොට තිබේ. 'පැසි' යන්න පාහින ලද ශුද්ධ කරන ලද යන අර්ථයයි.[1] ඒ අනුව පැසි සාල් යනු පාහින ලද ශුද්ධ කරන ලද සහල් යැයි ගතහොත් පැසි යන විශේෂණය රහිතව යොදන ලද්දේ නොපාහින ලද නිවුඩු සහල් යැයි ගත යුතුය. සතර දිගින් තුන්මසින් මස වැඩ දින තුනක් පමණක් නතරවන සංඝයාටත් ත්‍රිපිටක ග්‍රන්ථ ලියන්නන්ටත් නොපාහින ලද සහල් දෙන ලදැයි සිතන්නට එවිට සිදුවේ. පිරිවෙන් සාමීන්ට හා විහාරයේ වසන පස්නමට මුළුතැනටද තුන් බෝධියට හා නාථ මෛත්‍රී දෙතැනට මුළුතැනටද, නියම කොට ඇත්තේ පැසි සාල්ය. හෙවත් පාහින ලද ශුද්ධ කරන ලද සහල්ය. පැසි සාල් යන්නට කැකුළු යන විශේෂණය යොද කැකුළු පැසිසාල් යනුවෙන් විශේෂයෙන් යොද ඇත්තේ වර්තමානයේ මෙන්ම එකලද වී තම්බා කෙටීම හා නොතම්බා කැකුළෙන් කෙටීම යන ක්‍රම දෙකම ව්‍යවහාර වූ නිසායැයි සිතේ. ඒ අනුව පැසි සහල් යනු තැම්බු වියෙහි පාහින ලද හාල් ලෙසද, කැකුළු පැසි සාල් යනු නොතම්බා කැකුළෙන් කොටා පාහින ලද සහල් ලෙසද ගත යුතු වේ. මෙයේ ගන්නා විට අවුරුදු පූජාවට හා මවු බිසවුන් වෙනුවෙන් පැවැත්වුණු විශේෂ පූජාවට කැකුළු පැසි සහල් නියම කොට තිබේ. කිරිබත් පිසීමට ගන්නේ කැකුළු පැසි සහල්ය. අවුරුදු හා විශේෂ පූජාවලදී කැකුළු පැසි සහල් අවශ්‍ය වූයේ කිරිබත් පිසීමට විය හැකිය.

පැපිළියාන අවට හා දිවයිනේ විවිධ ප්‍රදේශවලින් වරින් වර පූජා කරන ලද කුඹුරු අක්කර 304ක ප්‍රමාණයක් ක්‍රි.ව. 1459 වන විට පැපිළියාන විහාරයට අයත්ව තුබූ බව ඉහත දුටුමු. මේ කුඹුරු වගා කරමින් සිටි ගොවීන්ද විහාරයට පූජා කොට තුබූ අයුරු පිරිවර වට්ටෝරුවෙන් දුටුමු. එවක් සිට ඒ ගොවීන් තමන් විසින් වගා කරන ලද කුඹුරුවල අස් වැන්නෙන් ප්‍රවේණි භාගය පැපිළියාන විහාරයට දිය යුතු විය. මේ ආකාරයෙන් සෑම කන්නයකට කුඹුරු වලින් ලැබෙන ප්‍රවේණි භාගය පැපිළියාන විහාරයේ වී බිස්සේ එකතු වන්නට ඇති අතර ඒ වීවලින් ඉහත දුටු අයුරු දිනපතා අවශ්‍ය සහල් ද ඊට අතිරේකව වසරකට වරක් පැවැත්වෙන විශේෂ පූජා දෙකට නැළි 450 ක්ද සඳහා වී වෙන් කෙරෙන්නට ඇත.

**පොල්:**

පොල් දෛනිකව හා වාර්ෂිකව දී ඇත. මේවා පැපිළියාන මැදිමාල ආදී විහාරය අවට ගම්වලින් ලැබෙන්නට ඇත. දිනපතා විහාර වාසී භික්ෂූන්ට හා සතර දිගින් වඩනා භික්ෂූන්ට අවශ්‍ය කසපැන්ද මේ අයුරින් ලැබෙන්නට ඇත.

1. ශ්‍රී සුශකෝ., 555

**ගලපාත ලිපියේ** ''පොල් පුවක් ඇතුළු කොළ වෙල් අය'' යන පාඨයක් තිබේ. මින් පොල් පුවක් කොළවෙල් වර්ගයට අයත් බවත් ඒවායින් ලැබෙන ආදායම් කොළවෙල් අය බවත් ඇඟවෙයි. එම ලිපියේම තවත් තැනක ඉඩමක සීමාවන් දක්වා ඒ අතුරෙහි වූ කොළවෙල් ගැන සඳහන් කොට ඇත. තවද තැනක ''වල් කපා කොළ වෙල් හිඳවූ'' යන්නක් ඇත.[1] මේ තැන් වල යෙදෙන කොළවෙල් යන්න පොදුවේ ගස කොළ යන අර්ථය නඟයි. ඇත්ත වශයෙන්ම පසුකාලීන ලිපිවල මෙබඳු තැන්හි යෙදී ඇත්තේ ගසකොළ යන්නය. ''කැරගල කුසලාන් ගම හා මෙහි බඳ ගෙවතු ගසකොළ'' යන්න නිදසුන් සේ දිය හැකිය.[2] මේ අනුව කොළවෙල් යනු පොදුවේ පොල් පුවක් බුලත් ආදී ගසකොළ සඳහා යෙදිණැයි පිළිගත හැකිය.

ක්‍රි.ව. 1432 පස්දුන් කෝරළය බඳ කුඩවැලි ගමින් පැපිළියානට පිදූ පිරිවර ජනයා අතර කොළවෙලුන්ගෙන් ගැහැණු පිරිමි හය දෙනෙකු හා අතර දරු දෙදෙනෙක් වෙති.[3] මේ අනුව ඉඩමක පොල් පුවක් බුලත් වැනි ගෙවතු ගස කොළ වගා කිරීමේ කටයුතු වල යෙදුණු වෙනම පිරිසක් සිටි බවත් ඔවුන් කොළ වෙලුන් නමින් හැඳින්වුණු බවත් පැහැදිලි වේ. ඉහත දුටු කොළෙවෙලුන් ඉන් පසු පැපිළියාන හා නැදිමාල ඇතුළු විහාර ගම්වල පොල් පුවක් බුලත් ආදී වැවිලිවල නිරත වන්නට ඇත. විහාරයට අවශ්‍ය පොල්, පුවක්, බුලත් ආදිය සැපයීම ඔවුන්ගේ වගකීම වන්නට ඇත. ඒ අනුව ඉහත ගණන් බලන ලද දිනකට අවශ්‍ය පොල් ප්‍රමාණය පැපිළියානේ විහාර සන්තක කොළ-වෙලුන් විසින් සපයන්නට ඇත.

**බුලත් පුවක්:**

බුලත් පුවක් දිනපතා විශාල ප්‍රමාණයක් අවශ්‍යව තිබිණ. තුන්බෝධියට හා නාථ මෛත්‍රී දෙපොළට දිනපතා කෙරෙන පූජාවට දිනකට බුලත් 26ක් හා පුවක් 15ක්ද අවශ්‍ය විය. ඒ හැරෙන විට ඒ ඒ පුද්ගලයන්ගේ තරාතිරමට අනුව අඩුවැඩි වන සේ දිනකට බුලත් හා පුවක් නියම වී තිබිණ. පිරිවෙන් පතීන් වහන්සේට හා සතර දිගින් වඩනා ආගන්තුක තෙර නමකට එක සමාන ගනණක් බුලත් 30ක් හා පුවක් 15 බැගින් නියමව තිබිණ.

එය වැඩිම ප්‍රමාණයයි. ඊළඟට වැඩිම ප්‍රමාණය විධානේ තැනටය. විධානේ තැනට බුලත් 15යි පුවක් 7ක් දිය යුතු විය. සෙසු නමකට බුලත් 12 පුවක් 6 බැගින්ද පොත් ලියන්නකුට හා ස්ථවිර නොවන ආගන්තුක නමකට බුලත් 10 පුවක් 5 යන වශයෙන්ද පුද්ගලයාගේ තරාතිරමට අනුව දිනපතා දෙන ලදි. එය විහාර සන්තක ගෙවතු ගස කොළ වගාවේ යෙදී සිටි ඉහත සලකා බලන ලද කොළ වෙලුන් විසින් දිනපතා සපයන්නට ඇත.

---

1. EZ., IV p. 203, ''කොළවෙල්'' යන වචනය පිළිබඳව බලන්න, EZ., IV p, 209, Note 2, මාතර දිස්ත්‍රික්කයේ දෙනියාය අසළ කොළවෙනිගම නමින් ගමක් ඇත. මෙය කොළවෙලිගම > කොළ වෙනි ගම යනුයෙන් සැදුණු නමක් විය හැකිය.
2. JCBRAS., Vol. XXII, p. 353.
3. ''කොළවෙලන්ගෙන්, පැබර දෙවායි, ගංදෙර නීලායි, දෙවායි, බණ්ඩි දෙවායි, මෙකුමල් ලොකායි, සොදිනාස්සියි, ඇතුළුවු නම් සයක් හා සොදිනාස්සිගේ දරු නම් දෙකක්. විද්‍යෝදය 1. 376.

**මිරිස්:**

**මිරිස්** දී ඇත්තේ මාස් පතාය. මෙහි මිරිස් නමින් හැඳින්වෙන්නේ ගම්මිරිස් බව නිසැකය. පැපිළියානට ඒ ඒ තැනින් දෙන ලද ඉඩම් අතර ගෙවතු වතු වැළැත් සඳහන් වේ.[1] මේ ගෙවතුවල හා වතු වැළැත්වල ගම්මිරිස් වගා කෙරෙන්නට ඇත. එයද විහාරයට ලැබුණු කොළවෙල් අය සේ සලකන්න ඇත. ගම්මිරිස් වේලා තබා ගත හැකි ද්‍රව්‍යයකි. එහෙයින් පැපිළියාන විහාරයේ ගම්මිරිස් ගබඩාවක් තිබෙන්නට ඇත. තුන් බෝධියට හා නාථ මෛත්‍රී දෙපළට මසකට නැළි දෙකක් ද, විහාරයේ වාසය කළ භික්ෂූන්ට නැළි හයක්ද, ලියන්නන්ට මසකට නැළි එකක්ද, බැගින් විහාරයේ ගම්මිරිස් ගබඩාවෙන් නිකුත් කර තිබේ. සිවු දිගින් වැඩි සඞ්ඝයාටද මිරිස් දිය යුතු බව දන්වා ඇතත් ප්‍රමාණයක් නියම කොට නැත්තේ එබඳු භික්ෂූන්ට මිරිස් අවශ්‍ය වන්නේ දින තුනකට පමණක් නිසා විය යුතුය. දින තුනකට අවශ්‍ය ප්‍රමාණය ඇතැම් විට විහාර වාසී භික්ෂූන්ට වෙන්වූ මිරිස්වලින් පිරිමසන්නට ඇත.

**ලුණු:**

තුන් බෝධියට හා නාථ මෛත්‍රී දෙතැනට මුළුතැන සඳහා දවසට වරක් බැගින් ලුණු මුක්කාලක් හෙවත් නැලි තුන්කාලක් බැගින් දී ඇත. අනෙක් වැය ශීර්ෂ සඳහා දී ඇත්තේ මසකට වරක් බැගිනි. පිරිවෙන් පතින් ඇතුළු විහාර වාසීන් සය නමට මුළුතැන සඳහා මසකට ලුණු නැළි 50 ක්ද, ත්‍රිපිටකය ලියන්නකුට ලුණු නැලි 10 බැගින්ද දී ඇත. සතර දිගින් වඩනා භික්ෂූන්ට ලුණු දිය යුතු බව කියා ඇත ද ප්‍රමාණය සඳහන් කොට නැත.

ඔවුන් සිටින්නේ තුන් දිනක් පමණක් නිසා නිශ්චිත ගණනක් කිව නොහැකි බව පැහැදිළිය. රජුගේ සූසාළිස් වැන්නේ ලිපියේ විහාරයට ලුණු පාරු එකක් නියම කර තිබේ. මේ වර්ෂයකට විය යුතුය. ඉහත දුටු ලුණු ප්‍රමාණය සපයන ලද්දේ වසරක් පාසා විහාරයට සැපයුණු ලුණු පාරු එකෙන් බව පැහැදිළිය.

**දූම්තෙල් හා ඉස්තෙල්:**

තුන්බෝධියට හා නාථ මෛත්‍රී දෙතැනට කෙරෙන මුළුතැන සඳහා මසකට දූම්තෙල් නැළි දෙකක්ද විහාරවාසී භික්ෂූන් සය නමට දූම්තෙලට හා ඉස්තෙලට නැළි විසි දෙකකුත් මනාවක් ද නියම කොට තිබේ. සතර දිගින් වඩනා මහා සංඝයාට දූම් තෙල් ඉස් තෙල් දිය යුතු බවක් කියා ඇතත් ප්‍රමාණ දක්වා නැත.

දූම් තෙල් යනු කෑම පිසීම සඳහා ගන්නා තෙල්ය. මෙය මී දෙනුන්ගේ කිරෙන් ගන්නා ගිතෙල්ය. රජුගේ සූ සාළිස් වැන්න වන විට විහාරයට සරක් දෙයාළක් හෙවත් සතළිස් දෙනකු පුද ඇත.[2] මේ තැන සරක් යනු එළහරක් මී හරක් දෙවර්ගය සඳහා යෙදුණකි. විහාරයට අයත්වූ මී හරකුන්ගෙන් දූම් තෙල් සැපයෙන්නට ඇත. ඉස් තෙල් යනු හිසෙහි ගාන තෙල්ය. මෙය තල තෙල් මී තෙල් ආදී බෙහෙත් තෙල් වර්ග විය යුතුය.

1. **''වතුවැළැත්''** යනු වතු ආසන්න බිම්ය. **ශ්‍රී සුශකෝ.**, 890.
2. **කස.**, 42.

**සඳුන් අගිල් ගුගුල්**

තුන් බෝධිය හා නාථ මෛත්‍රී දෙතැන පිරිබඩට, හෙවත් සුවඳ පැන් ඉසීමට හා සුවඳ දුම් ඇල්ලීමට මසකට වරක් බැගින් සඳුන්, අගිල් හා ගුගුල් යන මේවා පළම්වලින් දී තිබේ.[1] මීට අතිරේකව දිනපතා සුවඳ මල් දහය බැගින් සැපයිය යුතු විය. මේ ද්‍රව්‍යද විහාර සන්තක ගෙවතු ආදියෙන් විහාරයට සැපයෙන ලද බවට සැක නැත.

**මුදලින් කළ ගෙවීම්:**

ද්‍රව්‍යවලින් කළ ගෙවීම්වලට අතිරේකව ඇතැම් ද්‍රව්‍ය ගනු සඳහා මුදලින්ද ගෙවීම් කොට ඇත. මුදලින් ගෙවීම්ද දිනපතා මාස්පතා හා අවුරුදු පතා සිදුකොට ඇත. මේ සඳහා මුදල් ඒකක දෙකක් ව්‍යවහාර වී ඇත. රන් හෙවත් මසුරන් සහ පණම් යනුවෙනි.

මසුරන් අනුරාධපුර යුගයේ සිට ලක්දිව ව්‍යවහාරවූ මුදල් ඒකකයකි. මසුරමක බර හා වටිනාකම ඒ ඒ වකවානුවල වෙනස් වී ඇත. පහළොස් වැනි සියවසේ මසුරන් ඒකකයක වටිනාකම්, නිශ්චිත වශයෙන් දැක්වීමට සාධක නැත. පණම යටත් පිරිසෙයින් 14 සියවස මුල් භාගයේ සිට ව්‍යවහාර වී ඇති බැව් ලංකාතිලක ලිපිවලින් හා ගඩලාදෙණි ලිපි වලින් පැහැදිලි වේ.[2] පණම ඉන්දියාවෙන් මෙරටට පුරුදු වූවකැයි කොඩ්රිංටන් පෙන්වාදී ඇත. රන්වලින් රිදීවලින් හා තඹවලින්ද සාදන ලද පණම් ව්‍යවහාර වී තිබේ. පහළොස් වැනි සියවසේ ව්‍යවහාර වූ පණමේ බර හා අගය කොපමණ-දැයි නිශ්චය කළ නොහැක.[3]

මාලු සඳහා දිනපතා මසුරන් දී ඇත. මෙතැන මාලු යනු ව්‍යංජනය බව ඉහත දුටුමු. එළවළු ආදිය බැහැරින් ගනු සඳහා දිනපතා මුදල් දුන් බවක් මින් හැඟේ. ලුනු දුරු කහ ආදිය ගැනීම සඳහා තුන් බෝධියට හා නාථ මෛත්‍රී දෙපළට දිනකට මසුරන් එකක් දී ඇත. අනෙක් අය සඳහා මසකට වරක් බැගින් පණම්වලින් දී ඇත. සතර දිගින් වඩනා භික්ෂූන්ට ලුණු දුරු කහ ආදිය දිය යුතු වුවද ඒ සඳහා මුදල් ප්‍රමාණයක් සඳහන් කොට නැත.

එළවළු සඳහාද ලුණු දුරු කහ ආදිය සඳහාද මුදල්වලින් ගෙවන ලද්දේ ඒ ද්‍රව්‍ය විහාර සන්තක ඉඩම්වලින් නිෂ්පාදනය නොවූ නිසායැයි සිතන්නට සිදුවේ. එළවළු ආදිය විහාර ඉඩම් වල වවන ලද්දේ වුවද ඒවා පිට වෙළඳ පොළෙන් ගැනීම වඩා ප්‍රායෝගික වන්නට ඇත. ලුනු දුරු කහ ආදියද මේ අයුරින් වෙළඳ පොළෙන් මසකට වරක් ගන්නට ඇත.

මීට අමතරව වසරකට වරක් රෙදි සඳහා මුදල් නියම කොට තිබේ. ඒ පණම් වලිනි. රෙදිවල ප්‍රමාණය හා අගය තීරණය කොට ඇත්තේ ඒ ඒ පුද්ගලයාගේ තරාතිරම අනුවය. එසේ වුවද පිරිවෙන් සාමින්ට වසරකට දෙන සිවුරු දෙක සඳහා එකක් පණම් සියය බැගින් වටනා රෙදි නියම කොට ඇති අතර සෙසු නමකගේ සිවුරු දෙක සඳහා නියම කොට ඇත්තේ එකක් පණම් තිහ ගණනේ වටිනා රෙදිය. පිරිවෙන් පතින්ට වසරකට අඳනය සඳහා පණම් 25ක් වටනා රෙදි කඩක් නියමකොට ඇති අතර සෙසු

1. පළම කළං දෙළහකි. කළඳ මදටිය 20 ක බරය. (ඇම්. බී. ආරියපාල, මධ්‍යකාලීන ලංකා සමාජය 1962, 138–13, මේ අනුව පළම යනු මදටිය ඇට 240 බරය.
2. UCR., XVIII, p. 56: EZ., IV, 108.
3. **Codrington, H. W., Ceylon Coins and Currency**, pp. 80, 81.

නමකට පණම් 15 බැගින් වටනා රෙදි කඩක් බැගින් නියම කොට ඇත. පිරිවෙන් සාමීන්ට වත බඳනා දෙක සඳහා පණම් 10 බැගින් වටිනා රෙදි කඩ දෙකක් නියම කොට ඇති අතර සෙසු නමකට නියම කොට ඇත්තේ එකක් පණම් 2½ ගණනේවූ රෙදිකඩ දෙකකි. පිරිවෙන් පතීන්ට වසරකට අට පිරිකරක් නියම කොට ඇති අතර සෙසු නමකට ද වසරකට අට පිරිකරක් නියම කොට ඇත. එහෙත් ඒ සඳහා මිල නියම කොට නැත. ත්‍රිපිටක පොත් ලියන්නන් එක් අයකු වසරකට රෙදි එකක් සඳහා පණම් 100 ගණනේ දී ඇත. පොත් ලියන්නන්ට තමන් කැමති රෙද්දක් සඳහා මුදල් අතට දී ඇති අතර, පිරිවෙන් සාමීන් ඇතුළු විහාරවාසී භික්ෂූන් පස් දෙනාට මුදල් අතට දී නැත. ඒ ඒ පුද්ගලයාගේ තරාතිරමට අනුව රෙදි ප්‍රමාණයද ගතයුතු රෙද්දේ වටිනාකමද තීරණය කොට විහාරයේ භාණ්ඩාගාරයෙන් ඒ සඳහා නිකුත් කළයුතු මුදල් ප්‍රමාණය දක්වා ඇත. ඒ නියමිත මුදල් ප්‍රමාණයට රෙදි මිලට ගෙන ඒ රෙදි භික්ෂූන් අතට දිය යුතු විය.

දසවැනි සියවසේ මිහින්තලා ලිපිවලින්ද දහතුන් වැනි සියවසේ ගලපාත ලිපියෙන්ද විහාරයට අයත් මිල මුදල් හා වටිනා භාණ්ඩ තැන්පත් කිරිම සඳහා මුදු කරඬුව නමින් සිල් තැබිය හැකි සුරක්ෂිත මංජුසාවක් වූ බව පැහැදිලි වේ.[1] පැපිළියාන ලිපිවලින් තොරතුරක් නොලැබුණද පැපිළියාන විහාරයේද එබඳු මුදු කරඬුවක් තිබිණයැයි සිතිය හැකිය. දිනපතා ව්‍යංජන සඳහා මසුරන්ද, මාස්පතා ලුණු දුරු කහ ආදිය සඳහා මසුරන් හා පණම්ද වසරක් පාසා රෙදි සඳහා පණම්ද දෙන්නට ඇත්තේ විහාරයේ මේ මුදු කරඬුවෙන් විය යුතුය.

## V. විධානය, කළමනාකරණය

පිරිවෙන් පතීන් ඇතුළු නිත්‍යවාසී භික්ෂූන් හය නමටද ත්‍රිපිටක පොත් පත් ලියන ගිහියන්ටද සතර දිගින් වඩනා ආගන්තුක සංඝයාටද, යැපීම් සඳහා දෛනිකව මාසිකව හා වාර්ෂිකව ද්‍රව්‍යවලින් හා මුදල්වලින් ගෙවීමත්, තුන්බෝධියට හා නාථ මෛත්‍රී දෙතැනට දිනපතා කරන පූජාවටද ද්‍රව්‍ය හා මුදල් ගෙවීමත් යන මේවා සුනේත්‍රා මහා දේවි පිරිවෙන තුළ සිදුවූ අනිවාර්ය ආර්ථික ක්‍රියාකාර කම් යයි දැක්විය හැකිය. මේ ක්‍රියාකාරකම් මෙහෙයවන ලද්දේ කවුරුන් විසින්ද? ඒවායේ නියුක්ත වූවෝ කවරහුද? ඔවුන්ට නියමවූ සේවා කවරේද? ඔවුන්ට ගෙවන ලද්දේ කෙසේද?

10 වෙනි සියවසේ සෑගිරිය හා අබයගිරිය යන විහාරවල විවිධ තරාතිරමේ ආරාමිකයන් දසයන් විවිධ සේවාවල නියුක්තව සිටි බවටද ඔවුන්ට ඔවුන්ගේ සේවා සඳහා විවිධ මට්ටමේ ඉඩකඩම් හා වැටුප් ගෙවූ බවටද නිශ්චිත තොරතුරු ලැබේ. අවාසනාවට මෙන් පැපිළියානේ ලේඛන මේ අංශය පිළිබඳව මුළුමනින්ම නිහඬයැයි කිවයුතුය.

දිවයිනේ විවිධ ප්‍රදේශවල පැපිළියාන සන්තක ගොඩ, මඩ ඉඩම් රාශියක්, ගණන් බැලිය හැකි තරමින් ඉඩම් අක්කර 378 ක් පමණ වූ බව ඉහත දුටුමු. මේ ඉඩම් සමඟ පිරිවර ජනයා දෙසිය හැත්තෑවක්ද පැපිළියාන සන්තකව සිටියහ. මොවුන් ඉහත දුටු ඉඩකඩම් වගා කිරීමේ යෙදී සිටියහයි සිතිය හැකිය. මේ ඉඩම්වලින් නිපැදුණු වී, පොල්, බුලත්, පුවක්, මිරිස් ආදියෙන් ප්‍රවේණි භාගය පැපිළියානට ලැබිණැයි සිතිය හැකිය. එසේ වුවද ඒ ඒ ප්‍රදේශවලින් විශේෂයෙන් දකුණු පළාත සබරගමු පළාත සතර කෝරළය වැනි ඈත දුර ප්‍රදේශවල ඉඩම්වලින් මෙසේ ලැබුණු ආදයම කවුරුන් විසින් කෙසේ පැපිළියානට ගෙන එන ලදදැයි දැන ගන්නට සාක්ෂි නැත.

1. EZ., I, 87; IV, 204.

අභයගිරියේ හා සෑගිරියේ කොටගුලක් හෙවත් කෝෂ්ඨාගාරයක් තිබිණි. මෙම කෝෂ්ඨාගාරය රක්ෂාවෙහි නියුක්ත 'කොට රැකියන් සිටි අතර ඔවුන්ගේ නායක' කොට රැකිනා, නැමැත්තෙක්ද විය.[1] අනෙක් අතින් ආරාම සන්තක මිල මුදල් හා වටිනා භාණ්ඩ තැන්පත් කර තුබූ 'මුද්‍ර කරඬුවක්' හෙවත් මුද්‍රා තබන ලද පෙට්ටියක් විය. 13 සියවස තරමේ ගලපාත විහාරයේද මෙබඳු මුද්‍රා කරඬුවක් තිබිණ.[2]

පහළොස් වැනි සියවසේ පැපිළියානේ සුනේත්‍රා දේවි පිරිවෙනේ කොටගුලක් හෝ මුද්‍ර කරඬුවක් තුබූ බවට පැපිළියානේ ලේඛනවලින් සාක්ෂි නොලැබෙයි. එසේ වුවද පැපිළියාන හා ඒ අවටින්ද දිවයිනේ විවිධ ප්‍රදේශවලින් ද ලැබුණු වී, පොල් ආදිය එක් කොට තබන කොටගුලක් තිබුණාට සැක නැත. දිනපතා මාස්පතා සහල්, පොල්, බුලත්, පුවක්, සකුරු, දුම්තෙල්, ඉස්තෙල්, මිරිස්, ලුණු ආදිය නිකුත් කරන්නට ඇත්තේ මේ කොටගුලෙනි. අනෙක් අතින් දිනපතා මාස්පතා අවුරුදු පතා ඇතැම් වැය ශීර්ෂ වෙනුවෙන් මසුරන් හා පණම් නිකුත් කරන්නට ඇත්තේ ඉහත සළකා බලන ලද අයුරු මුද්‍ර කරඬුවකිනි.

අනිවාර්ය වැය ශීර්ෂ කිහිපයක් සඳහා දිනපතා මාස්පතා හා අවුරුදු පතා ද්‍රව්‍යවලින් හා මුදලින් කිසියම් නිශ්චිත ප්‍රමාණයක් ගෙවන ලද බව ඉහත සලකා බැලුමු. මේවා ක්‍රමානුකූලව ගණන් තබා දෛනිකව මාසිකව හා වාර්ෂිකව අය වැය වාර්තා සම්පාදනය කළයුතු විය. මෙසේ අය වැය තැබීමේ ක්‍රමයක් පැපිළියානේ වූ බවට අපගේ ලේඛන වලින් සාක්ෂි නොලැබේ.

දහවැනි සියවසේ සෑගිරියේ හා අභයගිරියේ කළමනා විවිධ කාර්යයන්හි නොයෙක් තරාතිරම්වල නිලධාරින් හා කම්කරුවන් නියුක්තව සිටි බවට තොරතුරු ලැබේ. ඔවුන්ගේ සේවාවන් හා ඒ සඳහා කරන ලද ගෙවීම් හා දීමනා පිළිබඳ තොරතුරු මිහින්තලා සෙල්ලිපි වලින් සවිස්තරව ලැබේ.[3] මේ අංශය පිළිබඳවද පැපිළියානේ ලේඛනවලින් ලැබෙන්නේ ඉතාම දළ තොරතුරු බිඳක් පමණි.

පැපිළියාන විහාරය පිළිබඳ සියළුම කටයුතු සිදුවිය යුත්තේ පිරිවෙන් පතීන් වහන්සේගේ නියෝග පරිදීය.[4] උන්වහන්සේ ළඟට දෙවැනිව වැදගත් තත්වයක් ඉසුලූ විධානේ තැන නැමති භික්ෂූන් වහන්සේ නමක් සිටි බව පෙනේ. ඇතැම් දීමනාවලදී උන්වහන්සේට විහාරවාසී සෙසු භික්ෂූන් සතර නමට වඩා ප්‍රමාණයක් නියම කර ඇති බව ඉහත දුටුමු. අනෙක් අතින් නිකපය ගම පිරිවෙන් පතීන් වහන්සේට සිවුපසය සඳහා වෙන් කර තැබුවාක් මෙන් විධානේ තැනට ද විහාර සන්තක වෙනත් ගම්වලින් අමුණු පහක් රජ අණින්ම වෙන් කොට දී තිබේ.[5] මින් හැඟී යන්නේ විධානේ තැන නමින් හැඳින්වුණ මේ භික්ෂූන් වහන්සේ පිරිවෙන් පතීන්ට දෙවැනි තැන උසුලමින් විශේෂ ක්‍රියා භාරයක් ඉටු කළ කෙනෙකු බවය.

1. EZ., I, p. 88.
2. EZ., I, p. 87., IV. 204.
3. මේ පිළිබඳව බලන්න. **Gunawardhane, Robe and Plough**, p. 117-130.
4. පිරිවෙන නියෝගවූ නියාවට නුගුළුවා, කස., 43.
5. විහාර සන්තක නොයෙක් ගම්වලින් විධානයට පසමුණක් හා., කය., 42.

පැපිළියානේ ශිලා ලේඛනය පිහිටවූ දිනම, එනම් ක්‍රි. ව. 1454 මැදින් පුරපසළොස්වක් දම නිකුත් කරන ලද මහ **සමන් දේවාල සන්නසේද** සමන් දේවාලය බද විහාරයට ගණනායක තෙර සාමීන් වහන්සේ නමක් ද විධානේ තැනක්ද තවත් සිල්වත් නමක්ද යනුවෙන් භික්ෂූන් තුන් නමකට සිවුපසය සඳහා ඉඩ කඩම් නියම කොට තිබේ.[1] මේ දෙපළේම කියැවෙන විධානේ තැන හා උන්වහන්සේට නියමිත කාර්ය භාරය කවරේදැයි ස්ථිරව දැනගත නොහැක.

**දඹදෙණි කතිකාවතේ** මහණවීමට පැමිණි පුද්ගලයකු සුදනම් කිරීම පිළිබඳව කියැවෙන තැන ප්‍රව්‍රජ්‍යාපෙක්ෂක කුල පුත්‍රයා තුන් නමක් ඇතුළු සංඝයා මධ්‍යයේ ජාති ගෝත්‍ර විචාර, විධානයෙහි සිටියවුන් මුණ ගැස්විය යුතු බව කියැවේ. ඉක්බිති විධානේ සිටියවුන් උපසම්පන්නයා පිළිබඳ සියල්ල විචාරා බලා නායක හිමියන්ට දක්විය යුතුය.[2]

මින් හැඟී යන්නේ 'විධානේ තැන' "විධානේ සිටියවුන්" නමින්ම හැඳින්වෙන පරිදි කටයුතු සම්පාදනයෙහි, විධාන කිරීමෙහි හෙවත්, නියෝග කිරීමෙහි නියැළී සිටි කෙනකු බවය. මිහින්තලා පුවරු ලිපිවල සඳහන් වන "නියම් ජෙට්ටු" යන තනතුරද[3] මේ විධානේ තනතුර බඳු වූවක් විය හැකිය.

පැපිළියානේ විහාරයේ ඉහත දුටු දෛනික හා වාර්ෂික පූජා සංවිධානය කිරීම, දෛනික මාසික වැය ශීර්ෂ නිකුත් කිරීම ගණන් තැබීම ආදිය විධානේ තැන විසින් ඉටු කළහයි සිතිය හැකිය.

පැපිළියාන විහාර සන්තක පිරිවර ජනයා අතුරින් පිරිවෙන් පතින් වහන්සේට අභියුක්ත සතර දෙනෙක්ද, සලාදරු පස් දෙනෙක්ද, දන් පිසින තුන් දෙනකුද, විහාරයේ නිත්‍ය වාසීව සිට සේවය කළහ. අනෙක් පිරිවර ජනයා විහාරවාසී භික්ෂූන්ට අත් පා මෙහෙවර කළයුතුය. තවද ආගන්තුකව එන භික්ෂූන්ට කළමනා උපස්ථානත් විහාර කර්මාන්ත ආදියත් කළ යුතුය. විහාරය ඇතුළත වූ සේවයන් පිළිබඳ තොරතුරු ලැබෙන්නේ මේ පමණකි.

## නිගමනය

මෙම අධ්‍යයනයේදී VI පරාක්‍රමබාහු රජතුමා විසින් ඔහුගේ මවු බිසවුන් සිහිවීම සඳහා කරවන ලද පැපිළියානේ සුනේත්‍රා මහා දේවි පිරිවෙනේ නඩත්තුව සඳහා ක්‍රි.ව. 1417–1460 දක්වා කාලය තුළ වරින් වර දෙන ලද දේපල එක්තුවූ ආකාරය එළිදරවූ විය.

ලේඛනවල දක්වා ඇති බිම් ප්‍රමාණය පමණක් ගණන් ගත් කල්හි, ගොඩ ඉඩම් අක්කර 74 යි පර්චස් 10 ක්ද, මඩ ඉඩම් අක්කර 304 රූඩ් 1යි පර්චස් 16ද යනුවෙන් මුළු ඉඩම් ප්‍රමාණය අක්කර 378 රූඩ් 1 යි පර්චස් 26 කි. පරිවාර ජනයා හෙවත් ගැහැණු පිරිමි වහල් සංඛ්‍යාව 270 කි. සරක් 40 දෙනෙකි. එක් ඇතින්නකි. ලුනු පාරු 1කි.

මේ දේපළ වලින් ලැබෙන ආදයම දෛනිකව මාසිකව හා වාර්ෂිකව නිශ්චිත වැය ශීර්ෂ වෙනුවෙන් ද්‍රව්‍ය වලින් හා මුදල් වලින් ගෙවා ඇත.

1. CALR., 11, 43.
2. කස., 9
3. 'නියම් ජෙටක් හට දිවෙල් පස් කිරියක් ඉසා.' EZ., 1, 87.

මෙසේ ගෙවා ඇත්තේ ප්‍රධාන වශයෙන් පිරිවෙන තුළ නිශ්චිත වූ පුද පූජා පැවැත්වීම ඇතුළු පිරිවෙනේ නඩත්තුව, පිරිවෙනේ නිත්‍ය වාසී භික්ෂූන්ගේ හා සතර දිගින් වඩනා ආගන්තුක භික්ෂූන්ගේ සිවු පසය සැපයීම, පිරිවෙන මගින් ඉටු කළ ජාතික සේවයක් වූ පොත් සුලබ කිරීමේ කාර්යය පවත්වා ගෙන යාම යන මේවා සඳහාය.

බාහිර සැදැහැවතුන්ගේ කිසිදු ආර්ථික අනුග්‍රහයකින් තොරව පිරිවෙන හා එහි නිවාසි භික්ෂූන්ට ස්වාධීනව පැවතිය හැකි ස්වයං පෝෂිත ආර්ථික සැලැස්මක් සකස් වී තිබුණ බව මෙම අධ්‍යයනයෙන් එළිදරවූ විය.

මෙම විශ්වවිද්‍යාලය පිහිටා ඇති භූමි භාගය පැපිළියානේ සුනේත්‍රා මහා දේවි පිරිවෙන් විහාරයට අයත් වූවකි. එය වර්තමාන සුනේත්‍රා මහා දේවි පිරිවෙන්පති වූද, විද්‍යොදය විශ්වවිද්‍යාලයේ ආදි ශිෂ්‍යයකු වූද, ශාස්ත්‍රපති පණ්ඩිත මැදගොඩ සුමනතිස්ස හිමියන්ගේ කැමැත්ත පරිදි විශ්වවිද්‍යාලයට පවරා ගන්නා ලද්දකි.

— සංස්කාරක —